# ප්‍රගති වාර්තාව 2023

## ධීවර අමාත්‍යාංශය

**මාලිගාවත්ත, කොළඹ 10**

# අන්තර්ගතය


| | | පිටු අංකය |
|---|---|---|
| **01** | ධීවර අමාත්‍යාංශය | **03-28** |
| **02** | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | **29 -62** |
| **03** | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | **63 - 69** |
| **04** | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය | **70 - 87** |
| **05** | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | **88 - 100** |
| **06** | ලංකා ධීවර සංස්ථාව | **101 - 107** |
| **07** | සී/ස සීනෝර් ආයතනය | **108 - 111** |

## දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.

## ප්‍රතිපත්තිමය අරමුණු

- විද්‍යානුකූල පදනමකින් යුත් (scientific base) තොරතුරු භාවිත කරමින් සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම
- ජාතික ජලජ සම්පත් සංවර්ධනය හා තිරසර භාවිතය
- නිෂ්පාදන  අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

## ධීවර අංශයට දායකත්වය සපයන ආයතන හා අරමුණු

| | |
|---|---|
| **ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**<br>(DFAR) | **අපේක්ෂිත අරමුණු** - ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය.<br><br>**වගකීම්** - කලාපීය සහ අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසිවලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම. |
| **ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය**<br>**(NARA)** | **අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය.<br><br>**වගකීම්** - 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසුඅස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව, ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම. |
| **ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**<br>(NAQDA) | **අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව ප්‍රවර්ධනය, කළමනාකරණය සහ නියාමනය.<br><br>**වගකීම්** - 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මගින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම, මිරිදිය හා ජලජීවී වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම. |
| **ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**<br>(CFHC) | **අපේක්ෂිත අරමුණු** - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 23ක් හා නැංගුරම්පොළවල් 58ක් පවත්වාගෙන යාම. |
| **ලංකා ධීවර සංස්ථාව**<br>(CFC) | **අපේක්ෂිත අරමුණු** - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපොළ සඳහා දායක වීම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකරයි. |
| **සීමාසහිත සීනෝර් පදනම** | **අපේක්ෂිත අරමුණු** - ධීවර කර්මාන්තයට අදාළ වන්නා වූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.<br><br>**වගකීම්** - 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු, බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියලුම ධීවර ආම්පන්න අළෙවිය සිදු කරයි. |

# 01
# ජාතික ආර්ථිකයේ වර්ධනයට ධීවර අංශයේ දායකත්වය

## 2023 වර්ෂයේ ධීවර අංශයේ සමස්ත ප්‍රගතිය

ප්‍රධාන වශයෙන් මත්ස්‍ය සම්පතින් ගහණ වර්ග කි.මී. 517,000ක සාගර සම්පතක් හා සංවර්ධනය කළ හැකි කළපු, මෝය හා වැව් වලින් යුතු හෙක්ටයාර් 489,000 ක ජලාශ පද්ධතියකින් ශ්‍රී ලංකාවේ ධීවර අංශය සමන්විතය. එසේම අතීතයේ සිට ධීවර සම්පත් නෙළාගැනීම ජීවනෝපාය කරගත් ධීවර ප්‍රජාව මෙන්ම ඒ හා සම්බන්ධ වක්‍ර සේවා නියුක්තියකින් සමන්විත වූ මානව සම්පත ජාතික ආර්ථිකය ඔසවා තැබීමට මහඟු පිටිවහලක් සපයයි. මෙම මානව සම්පත් හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදාගැනීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ඉහල තලයකට රැගෙන ඒමට අවශ්‍ය යටිතලපහසුකම් ඉහළ නැංවීමට හා ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම වෙනුවෙන් රජය විසින් වාර්ෂිකව විශාල පිරිවැයක් දරනු ලබයි.

කෝවිඩ් වසංගත තත්ත්වය මත ඇති වූ පසුකාලීන ආර්ථික අවපාත තත්ත්වය හා ඉන්ධන මිල ඉහළ යාම, ධීවර කර්මාන්තයේ ප්‍රගමණයට දැඩි බලපෑමක් එල්ල වුවද, 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී කරදිය ධීවර කර්මාන්තය තුළින්මෙ.ටො 213,065ක හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් මෙ.ටො 80,815ක මත්ස්‍ය අස්වැන්නක් ලබාගැනීමට සමත්වී ඇත. ඒ අනුව මෙම කාලපරිච්ඡේදය තුළ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 292,765කි.

ජාතික ආර්ථිකය හා විදේශ සංචිතයන්හි වර්ධනයට මත්ස්‍ය අපනයන තුළින් සුවිශේෂී දායකත්වයක් සපයන අතර 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී අපනයනය කරන ලද සමස්ත මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො 17,890.7කි. එහි වටිනාකම රු.මි 72,640.7කි. එසේම අදාළ කාලපරිච්ඡේදය තුළදී විසිතුරු මසුන් අපනයනය තුළින් රු.මි 6,373.7 ක ආදායමක් ලබා ගැනීමට හැකි වී ඇත. මෙය පසුගිය වර්ෂයන්ට වඩා වාර්තාගත අපනයන ආදායමක් ලෙස සඳහන් කළ හැක.

මහජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා ප්‍රධානතම ප්‍රෝටීන් මූලාශ්‍රය ලෙස මත්ස්‍ය පරිභෝජනය සැලකිය හැකි අතර, 2023 ජනවාරි සිට සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුලදී ඒක පුද්ගල. මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 32.89 කි. දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් ඉදිරියේදී මෙම අගයෙහි ක්‍රමික වර්ධනයක් අපේක්ෂා කෙරේ.

දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවකාශය පුළුල් කරමින්, ආහාර සුරක්ෂිතතාවය, පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීම, රැකියා උත්පාදනය, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත්කරලීම උදෙසා උපරිම දායකත්වයක් ලබාදීමේ අරමුණින් යුතුව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සම්ප්‍රදායික නොවන මත්ස්‍ය වගා ව්‍යාපෘති එනම්, මුහුදු කූඩැල්ලන්, මුහුදු පැළෑටි හා මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘති 2023 වසර පුරා ක්රියාත්මක කර ඇත.

වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති තඹලයා, දඹුල්ල මත්ස්‍ය ජාන ඒකකයේ දී විවිධ විද්‍යාත්මක ක්‍රම පදනම් කර ගනිමින් පරීක්ෂණ සිදුකර එහි ප්‍රතිඵලයක් ලෙස අවුරුදු 2කකට පසු ප්‍රේරිත අභිජනන ක්‍රමවේදය මගින් අභිජනනය සාර්ථක කර ගැනීමට හැකි විය. ලෝක ජෛව විවිධත්ව දිනයට සමගාමීව 2023.05.22 දින ඉහළ මල්වතුඔය ද්‍රෝණියේ පිහිටි හබරණ තුම්බිකුලම් වැවට තඹලයා මසුන් 32,000ක් තැන්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂ සංරක්ෂණය කිරීම සඳහා සංවිධානය කරන ලද පළමු වැඩසටහන ලෙස මෙය ඉතිහාසගත විය. මෙම ස්වාභාවික පරිසරයෙන් තුරන්

වීමේ අවධානමට ලක් වූ මත්ස්‍යයන් ඔවුන්ගේ නිජභූමියට නැවත හඳුන්වාදීමේ වැඩසටහන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් විශ්වවිද්‍යාල සහ මේ හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු ධීවර විශේෂඥ කණ්ඩායම්වල සහාය ඇතිව සිදුකරන ලදි.

ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය උසස්කරලීම, මත්ස්‍ය පසුඅස්වනු හානිය අවම කර ගැනීම මගින් ගුණාත්මක තත්ත්වයේ මත්ස්‍ය නිෂ්පාදන අරමුණු කරමින් ධීවර වරාය හා නැංගුරම්පොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2023 වසරේදී සිදු කරන ලද ප්‍රමුඛ වැඩසටහනකි. මේ අනුව රැකව හා මාවැල්ල නැංගුරම්පොළවල් සාදා නිමකර ඇති අතර, වැල්ලමංකර ධීවර වරාය ක්‍රියාත්මක තත්ත්වයේ පවති. මීට අමතරව ගන්දර හා මයිලිඩ්ඩි ධීවර වරායන්වල සංවර්ධන කටයුතු ද මෙම වසර පුරා ක්‍රියාත්මක විය.

කළපු පරිසර පද්ධතිය තිරසර ලෙස කළමනාකරණය කිරීම මගින්, කළපු ආශ්‍රිත ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පමණක් නොව , කළපු ආශ්‍රිත ස්වභාවික මත්ස්‍ය අභිජනනය සක්‍රිය කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් කළපු සංවර්ධන වැඩසටහන 2023 වසර පුරා ක්‍රියාත්මක විය. මේ යටතේ ආරුගම්බේ, ලංකාපටුන, නයාරු හා නන්දිකඩාල් කළපු ආශ්‍රිතව සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර දකුණු පළාතේ රැකව, ගරාඩුව හා කොග්ගල කලපු තුන ඒකාබද්ධ ප්‍රවේශයකින් සංවර්ධන සැලසුම් සකස් කරමින් පවතී. එමගින් රටට විදේශ විනිමය උත්පාදනය කිරීම සඳහා එම කළපුවල දායකත්වය ඉහළ නැංවීමට හැකිවනු ඇත.

චීන සහ ජපන් රජයන් මඟින් මෙන්ම ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය ලබාදුන් ආධාර ව්‍යාපෘති කිහිපයක්ද මෙම වසරේදි ක්‍රියාත්මක විය. කෝවිඩ් වසංගතය හා පසුකාලීනව ඇතිවූ ආර්ථික අවපාතය සහ ඉන්ධන හිඟය ධීවර ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වෙත අහිතකර බලපෑමක් එල්ල කෙරිණි. මෙම අවස්ථා යටතේ විදේශ අධාර මගින් ඔවුන් වෙත ලබාදුන් ආධාර ධීවර ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම හා සමාජ සුභසාධනයට රුකුලක් විය.

සමස්තයක් වශයෙන් ගත් කල ආර්ථික වශයෙන් රට මුහුණ දී ඇති දුෂ්කර කාලපරිච්ඡේදයක වුවද, ධීවර අමාත්‍යාංශය විසින් තම යටතේ වූ ධීවර දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන සමග සාමූහිකව ගනු ලබන සියලු ක්‍රියාමාර්ගයන් මගින් ධිවර හා ජලජ සම්පත් තිරසර භාවයෙන් යුතුව පවත්වා ගැනීමටත්, ධිවර ප්‍රජාවගේ සමාජ හා ආර්ථික මට්ටම ප්‍රශස්ථ තත්ත්වයක් කරා ළඟා කරගැනීමටත් හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.




**2023 වර්ෂයේ රාජකාරි ආරම්භ කළ අවස්ථාව**




**මුහුදෙන් නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්න සුරක්ෂිතව ගොඩබිමට ගෙන ඒම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දුන් සිසිලන පද්ධති සහිත ප්‍රථම බහුදින ධීවර යාත්‍රාව දික්ඕවිට වරායෙන් 2023.01.03 දින දියත් කළ අවස්ථාවට ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගීත්වය.**





**ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඉන්දීය විද්වතුන් කළ නිරීක්ෂණ ධීවර අමාත්‍යතුමාට ඉදිරිපත් කළ අවස්ථාව**

**උතුරු මුහුදේ ඉන්දීය ධීවරයන් සිදුකරන නීති විරෝධී ධීවර කටයුතු මුළුමනින්ම නවතා දැමීමට අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධව ධීවර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.01.24 දින පැවති සාකච්ඡාව.**





කිලිනොච්චියේ කල්මඩුකුලම් වැවේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට වැවේ ජල මට්ටම මුළුමනින්ම ඉවත් කිරීම නිසා එහි රැකියාවේ නිරත වූ ධීවර ජනතාවට සහන සැලසීම පිණිස 2023.03.15 දින ධීවර අමාත්‍යතුමා එම ප්‍රදේශයේ සිදු කළ නිරීක්ෂණ චාරිකාව

බණ්ඩාරගම මිල්ටන් මෝටස් නමැති පුද්ගලික ආයතනය විසින් විදුලි කෝෂ මගින් ක්‍රියා කරන ධීවර බෝට්ටු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ධීවර අමාත්‍යතුමා විසින් නිරීක්ෂණය.





මාලදිවයින් රජය සහ එරට යාත්‍රා සම්මේලනය එක්ව 2023 මාර්තු 15 සිට 18 දක්වා දිනවල සංවිධානය කළ "Maldives Marine Expo 2023" මාලදිවයින් යාත්‍රා හා උපාංග ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ අවසන් දින ආරාධිතයනකු ලෙස සහභාගී වූ ධීවර රාජ්‍ය අමාත්‍යතුමා විසින් ධීවර නියාමන සහ තාක්ෂණික කටයුතුවලදී මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට කඩිනමින් විධිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතු බවට ප්‍රකාශ කරන ලදි.



තහනම් පන්න ක්‍රමයක් වන ඩයිනමයිට් හා වෙඩි බෙහෙත් යොදාගනිමින් සිදුකරන මසුන් මැරීම නැවැත්වීම සඳහා අවශය පියවර ගැනීම පිළිබඳව ධීවර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.08.10 වන දින පැවති සාකච්ඡාව.



ත්‍රිකුණාමලය ඇතුළු නැගෙනහිර පළාතේ නීති විරෝධී ලෙස මසුන් මැරීම නතර කිරීම සඳහා ගතයුතු වැඩපිළිවෙළ පිළිබඳව ධීවර අමාත්‍යතුමා හා නැගෙනහිර ආණ්ඩුකාර සෙන්දියල් තොන්ඩමන් මහතා අතර 2023.07.26 දින පැවති සාකච්ඡාව



හලාවත කළපුව ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා ධීවර අමාත්‍යතුමා විසින් ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා ධීවර නියෝජිතයින් සමග 2023.06.06 දින තළ සාකච්ඡාව.



පැලියගොඩ මත්ස්‍ය වෙළඳසැලට අවශ්‍ය අයිස් අඩු මිලට සැපයීම සඳහා ධීවර අමාත්‍යතුමා අදාල සැපයුම් කරුවන් සමග පැවති සාකච්ඡාව



ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නඟාසිටුවීම සඳහා යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා තානාපති ඩෙනිෂ් වයිබ් මහතා ඇතුළු නියෝජිත පිරිසක් සමග 2023.05.24 දින පැවති සාකච්ඡාව.



දකුණු කොරියාවේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයකු වන කංග් මහතා ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රය තුළ ආයෝජනයන් කිරීමට අවශ්‍ය කටයුතු පිළිබඳව ධීවර අමාත්‍යතුමා සමග පැවති සාකච්ඡාව.

# සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනයේ දායකත්වය

## 1.1 වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කර ගැනීම.

2023 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දිවයිනේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 292,765 ක් විය. මෙහි වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙනි. එහි ප්‍රතිශතය 40% කි. එසේම පිළිවෙළින් 32.7%ක් ගැඹුරු මුහුදෙන් හා 27.2%ක් මිරිදිය හා ජලජීවී වගාව මඟින් දායකත්වයක් සැපයේ.

## 1.2 කරදිය මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළාසන්න, අක්වෙරළ/ ගැඹුරු මුහුද)

සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ දායකත්වය ක්‍රමානුකූලව වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත. 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 95,870ක් ද, වෙරළාසන්න ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 117,195ක අස්වැන්නක් ද ලබාගැනීමට හැකිවූ අතර, සමස්ත කරදිය අස්වැන්න මෙ.ටො. 213,065 කි.

## 1.3 මිරිදිය හා ජලජීවී වගා නිෂ්පාදනය

2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරාසය තුළ සමස්ත මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය මෙ.ටො. 80,815ක් වූ අතර සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මෙහි දායකත්වය 27.6% කි.

2023 සැප් 30 වන විට සමස්ත මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 54.46 ක් වන අතර ඉන් මිලියන 17.86ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් නිෂ්පාදනය කර ඇති අතර, ඉතිරිය ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු, ජලාශ තුළ දැල්කූඩු හා කොටු භාවිතය මඟින් නිෂ්පාදනය සිදු කොට ඇත.

2023 සැප් 30 වන විට සමස්ත මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය මිලියන 32.15 ක් වන අතර ඉන් මිලියන 25.01ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් නිෂ්පාදනය කර ඇති අතර ඉතිරිය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයෙන් දායකත්වය ලැබී ඇත.

එසේම පෞද්ගලික අංශය විසින් කිවුල් දිය ඉස්සන් පසුකීටයන් මිලියන 591ක් නිෂ්පාදනය කර ඇත.

2023 වසරේ දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවකාශය පුළුල් කරමින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීම, රැකියා උත්පාදනය , අපනයන වර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරලීම උදෙසා උපරිම දායකත්වය ලබා ගැනීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් වගා පාදක ධීවර කර්මාන්තය, කිවුල්දිය හා වෙරළබඩ ජලජීවී වගාව ආශ්‍රිතව සංවර්ධනය සඳහා විවිධ දිස්ත්‍රික්කයන්හි කටයුතු ක්‍රියාවට නංවා ඇත.

# මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත

**මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)**

| ධීවර උප අංශ | | 2019 | 2020 | 2021 | 2022 | 2022 (ජන-සැප්) | 2023 (ජන-සැප්) | වෙනස 2023-2022 (%) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගැඹුරු මුහුදෙන් | 172,910 | 144,370 | 153,415 | 131,170 | 96,080 | 95,520 | (0.58) | 32.7 |
| 2 | වෙරළාසන්න | 242,580 | 182,560 | 178,260 | 149,440 | 109,520 | 116,900 | 6.74 | 40.0 |
| | **මුළු කරදිය** | **415,490** | **326,930** | **331,675** | **280,610** | **205,600** | **212,420** | **3.32** | **72.7** |
| 3 | මිරිදිය | 73,230 | 84,310 | 80,720 | 94,860 | 67,410 | 64,355 | (4.53) | 22.0 |
| 4 | ජලජීවී වගා | 10,710 | 10,140 | 9,105 | 7,680 | 5,900 | 6,800 | 15.25 | 2.3 |
| 5 | ඉස්සන් | 6,400 | 7,360 | 14,410 | 14,080 | 11,730 | 8,545 | (27.15) | 2.9 |
| | **මුළු මිරිදිය** | **90,340** | **101,810** | **104,235** | **116,620** | **85,040** | **79,700** | **(6.28)** | **27.3** |
| | **සමස්ථ නිෂ්පාදනය** | **505,830** | **428,740** | **435,910** | **397,230** | **290,640** | **292,120** | **0.51** | **100.0** |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය

# 2023 මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත

**ආංශික මත්ස්‍ය නිෂ්පාදන (මෙ.ටො.)**

| | කරදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | | සමස්ථ නිෂ්පාදනය |
|---|---|---|---|---|---|---|---|---|
| | අක් වෙරළ | වෙරළාසන්න හා කළපු | මුළු කරදිය | මිරිදිය | ජලජීවී වගා | ඉස්සන් | මුළු මිරිදිය | |
| **2023** | **95,520** | **116,900** | **212,420** | **64,355** | **6,800** | **8,545** | **79,700** | **292,120** |
| ජන | 11,220 | 14,170 | 25,390 | 6,710 | 475 | 860 | 8,045 | 33,435 |
| පෙබ | 11,610 | 14,670 | 26,280 | 6,530 | 495 | 910 | 7,935 | 34,215 |
| මාර්තු | 12,490 | 14,710 | 27,200 | 6,460 | 460 | 1,070 | 7,990 | 35,190 |
| අප්‍රේල් | 11,900 | 12,990 | 24,890 | 5,880 | 390 | 1,180 | 7,450 | 32,340 |
| මැයි | 8,360 | 13,520 | 21,880 | 6,330 | 410 | 1,450 | 8,190 | 30,070 |
| ජුනි | 8,320 | 10,780 | 19,100 | 6,565 | 550 | 935 | 8,050 | 21,150 |
| ජූලි | 10,220 | 10,730 | 20,950 | 7,280 | 860 | 990 | 9,130 | 30,080 |
| අගෝ | 11,510 | 12,060 | 23,570 | 9,600 | 2,160 | 550 | 12,310 | 35,880 |
| සැප් | 9,890 | 13,270 | 23,160 | 9,000 | 1,000 | 600 | 10,600 | 33,760 |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය



## 1.4. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කර ගැනීම.

මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීමෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ ඌනතාවයන් අවම කර මන්දපෝෂණයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කර ගැනීමට මහ පාදයි.

2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 32.89 ක් ලෙස වාර්තා වී ඇත. මෙම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය සඳහා දේශීය කරදිය හා මිරිදිය නිෂ්පාදන මෙන්ම ආනයනය කරන ලද මත්ස්‍ය නිෂ්පාදනද දායකවී ඇත.

## 1.5. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය

හාල්මැස්සන්, කරවල, උම්බලකඩ, ටින් මාළු හා ආහාරයට ගන්නා මසුන් මෙරටට ආනයනය කරනු ලබන ප්‍රධානතම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වේ. මුළු ආනයනයෙන් වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කරවල හා හැල්මැස්සන් ය. ආනයනික මත්ස්‍ය ප්‍රමාණයෙන් කොටසක් අගය වැඩි කොට ප්‍රති අපනයනය කරන අතර ඉතිරිය දේශීය පරිභෝජනයට යොදා ගැනේ. දේශීය මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය අතර පරතරය පිරවීමට මෙම ආනයන ඉතා වැදගත්ය. 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 34,412.5ක් ආනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 16,952.2කි.

### වගුව 1.5.1 ආනයනික මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල වටිනාකම

| අයිතමය | 2020 | 2021 | 2022 | 2021 (ජන-සැප්) | 2022 (ජන - සැප්) | 2023 (ජන - සැප්) | වෙනස % 2023/ 2021 | වෙනස % 2023/ 2022 | මුළු ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| කරවල | 6,353 | 4,871 | 3,470.0 | 3,845.3 | 2742.9 | 2546.6 | -33.7 | -7.15 | 15.0 |
| වියළි හාල්මැස්සන් | 10,927 | 9,119 | 9,955.5 | 6,766.4 | 7227.1 | 6166.3 | -8.6 | -14.6 | 36.4 |
| උම්බලකඩ | 1,924 | 1,453 | 925.7 | 1,065.8 | 686.2 | 675.1 | -36.6 | -1.6 | 3.9 |
| ටින් මාළු | 10,764 | 4,891 | 2,671.9 | 3,509.7 | 2156.1 | 3139.6 | -10.5 | 45.6 | 18.5 |
| මත්ස්‍ය ආහාර | 4,659 | 3,401 | 2,107.9 | 2,582.0 | 1632.8 | 1930.8 | -25.2 | 18.2 | 11.4 |
| සජීවී මත්ස්‍යයින් | 175 | 253 | 430.0 | 167.2 | 309.7 | 270.8 | 61.9 | -12.5 | 1.6 |
| අනෙකුත් | 703 | 1,091 | 2,103.2 | 872.1 | 1581.3 | 2222.8 | 154.8 | 40.56 | 13.1 |
| **එකතුව** | **35,504** | **25,080** | **21,664.2** | **18,808.5** | **16336.2** | **16952.2** | **-9.8** | **3.7** | **100.0** |

**මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය**

## 1.6. මත්ස්‍ය අපනයනය

අපනයනය ක්ෂේත්‍රය තුළ මත්ස්‍ය ආහාර, විසිතුරු මසුන් හා මුහුදු පැළෑටි අපනයනයෙන් ජාතික ආර්ථිකය සවිමත් කරලීම උදෙසා ධීවර අංශයෙන් ප්‍රමුඛ වූ දායකත්වයක් ලබා දෙනු ලැබේ. මෙම කාර්යය ඉටුකිරීමේදී ආනයනික රටවල නියෝගවලට අනුගත වෙමින් ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් යුතු උසස් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා එම කාර්යයේ නියුතු පාර්ශ්වකරුවන්ට නිසි මඟ පෙන්වීම හා ආධාර ලබා දීම මගින් මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීමට පියවර ගෙන ඇත.



ජලජ සම්පත් අපනයනය කිරීමේදී දමිළ ඩයස්පෝරා අපනයනකරුවන් සම්බන්ධකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව ධීවර අමාතයතුමා විසින් හිටපු අමාත්‍ය විනයාගමූර්ති මුරලිදරන් හා සංක්‍රමණික අපනයනකරුවන් සමග 2023.08.21 දින පැවති සාකච්ඡාව.



විශාල අපනයන ආදායමක් ලබාදෙන ඉස්සන් කර්මාන්තය නංවාලීම සඳහා අවශය රාජ්‍ය සහයෝගය ධීවර අමාත්‍යාංශය මගින් ලබාදෙන බව ධීවර අමාත්‍යතුමා විසින් ජලජීවී වගා සංවර්ධන සංගමයේ නියෝජිතයින් හා ඊට අදාළ අමාත්‍යාංශයේ ආයතන නිලධාරීන් සමග 2023.08.11 දින පැවති සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලදී.



රටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන මාර්ගයක් ලෙස මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇති බැව් 2023.01.08 දින කිලිනොච්චිය කිරන්චි ප්‍රදේශයේ මුහුදු කූඩැල්ලන් වගා කරුවන් සඳහා හිමිකම් පත් ප්‍රදානය කිරීමේ උත්සවයේදී ධීවර අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලදී.



මත්ස්‍ය අපනයනයෙන් රටට නීත්‍යානුකූලව ලැබීමට ඇති මුදල් ඒ ආකාරයෙන්ම රටට ලැබීමට සැලැස්වීම අපනයන කරුවන්ගේ යුතුකම හා වගකීම බැවින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට 2023.03.20 දින ධීවර අමාත්‍යතුමා හා මත්ස්‍ය අපනයනකරුවන් අතර පැවති සාකච්ඡාව.

වගුව 1.6.1 : මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල අපනයන ප්‍රමාණය හා වටිනාකම

| මත්ස්‍ය වර්ගය | අපනයන ප්‍රමාණය (මෙ.ටො.) | | අපනයන වටිනාකම (රු.මිලි.) | |
|---|---|---|---|---|
| | 2022 | 2023 ජන-සැප් | 2022 | 2023 ජන-සැප් |
| සජීවී මසුන් | අදාල නැත | අදාල නැත | 7,143.0 | 6,373.7 |
| ඉස්සන් | 5,486.4 | 2,942.6 | 13,174.5 | 7,349.0 |
| පොකිරිස්සන් | 113.9 | 79.6 | 1,060.5 | 923.8 |
| කකුළුවන් | 1,849.5 | 1,171.8 | 7,796.5 | 5,320.6 |
| මුහුදු කූඩැල්ලන් | 417.6 | 308.2 | 3,806.0 | 3,592.6 |
| වෙනත් මෘද්වංශිකයින් | 2,087.9 | 2,243.8 | 3,881.9 | 4,326.0 |
| මෝරා | 79.2 | 78.8 | 922.4 | 1,076.5 |
| මාළු බොකු | 7.1 | 6.2 | 155.5 | 225.0 |
| බෙල්ලන් සහ කවච මසුන් | 271.1 | 187.4 | 228.2 | 164.3 |
| සකස් කළ මසුන් | 14,959.0 | 10,565.3 | 57,528.1 | 42,303.5 |
| වෙනත් | 458.3 | 307.1 | 1,546.1 | 985.6 |
| **මුළු එකතුව** | **25,729.9** | **17,890.7** | **97,242.8** | **72,640.7** |





මුහුදු කූඩැල්ලන්, කකුළුවන්, ඉස්සන් හා විසිතුරු මසුන් ඇතිකිරීම යන අංශවලට අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික සහය ලබාදීම ඇතුළත්ව ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සහාය ලබාගැනීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් ආචාර්ය සත්‍යාන්ජල් පාන්ඩේ මහතා හා ධීවර අමාත්‍යතුමන් අතර 2023.09.23 දින පැවති සාකච්ඡාව.



## 1.7. විසිතුරු මසුන් අපනයනය

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම, අභිජනන කටයුතු, මත්ස්‍ය රෝග නිර්ණය සහ රෝග පැතිරීයාම වැළැක්වීම, ගුණාත්මක තත්ත්වයේ මව් සතුන් ලබාදීම, ගුණාත්මක තත්ත්වයේ ආහාර ලබා දීම හා සම්බන්ධව වගා කරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම, නාරා ආයතනයේ සහයෝගයෙන් මසුන්ගේ නව ප්‍රභේද බිහි කිරීම, තාක්ෂණික සංවර්ධනය, මත්ස්‍ය රෝග නිර්ණය, වගා කරුවන්ට ණය සහන ලබා ගැනීමට සහාය වීම ආදී ක්‍රමෝපායන් මඟින් විසිතුරු මසුන් අපනයනය දිරිමත් කිරීමට කටයුතු යොදා ඇත.

2023 වසරේ ජනවාරි - සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් රු.මිලියන 6373.7 ක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත.







විදේශ විනිමය උපයන මාර්ග අතුරෙන් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සහ ජලජ පැළෑටි කර්මාන්තය ප්‍රමුඛව සැලකෙන අතර, එම කර්මාන්ත කරුවන්ට අවශ්‍ය යටිතලපහසුකම් පිළිබඳව සොයා බැලීම සඳහා ධීවර අමාත්‍යතුමා විසින් 2023.04.30 දින කැලණි මිටියාවත ප්‍රදේශයේ හෝමාගම හා පාදුක්ක ප්‍රදේශයන්හි නිරීක්ෂණ චාරිකාවක නිරත වීම.

# ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

මෙම අමාත්‍යාංශය මඟින් ධීවර සංවර්ධනය ඉලක්ක කර ගෙන ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා සමස්ත ධීවර සංවර්ධනයට අදාළ කාර්යයන් කෙරෙහි බලපාන ප්‍රතිපත්ති සම්පාදනය ධීවර සමාජ සංවර්ධන අංශයෙහි ප්‍රමුඛ වගකීමයි. ඒ අනුව, ධීවර අංශය සම්බන්ධයෙන් මෙරට ජාතික ප්‍රතිපත්තියෙහි සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, පසුඅස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම, ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම, අපනයන ආදායම් ඉහළ නැංවීම, විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම, ධීවර ප්‍රජාවගේ සමාජ - ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම. යන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍යය සියලු වැඩසහටන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සංවර්ධන අංශයෙහි කාර්ය භාරයයි.

## A. කළපු සංවර්ධනය හා සංරක්ෂණය කිරීම

කළපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා සංවර්ධනයෙන් ජලජීවී නිෂ්පාදන ඉහළ නැංවීම ප්‍රධාන උපාය මාර්ගය කර ගනිමින් මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණෙන් යුතුව කළපු සංවර්ධනය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

කළපු පිරිසිදු කිරීම හා කළපුවේ ජල හුවමාරුව ක්‍රමවත්ව සිදුවන පරිදි ඇළ මාර්ග ගැඹුරු කිරීමෙන් කළපු තුළ ස්වභාවික මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම, ජලජීවී වගා සංවර්ධනය, පසුඅස්වනු නාස්තිය අවම කිරීම ඉලක්ක කර ගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අනවසර අල්ලා ගැනීම් හා ගොඩකිරීම් වළක්වා සංරක්ෂණය කෙරෙහි ඉවහල් වන කළපු මායිම් ලකුණු කිරීම, ජීවනෝපාය සංවර්ධනය, කඩොලාන සංරක්ෂණය කිරීම, තහනම් ආම්පන්න ඉවත් කිරීම හා කළපු කළමනාකරණය ශක්තිමත් කිරීම හා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙහි සෘජු අරමුණු වේ. එමෙන්ම නව රැකියා අවස්ථා බිහි කිරීම, සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කිරීම යන ඉලක්කයන් ද මෙම ව්‍යාපෘතිය තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. 2023 වර්ෂයෙහි මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 226.45ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව එක්ව තවත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. කළපු 11ක් සඳහා ප්‍රධාන සැලසුම් (Master Plan) සකස් කිරීම - ආරුගම්බේ කළපුවෙහි රොන්මඩ ඉවත් කිරීම සඳහා පිරිවිතර, ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර සකස් කිරීම.
2. ආරුගම්බේ කළපුවෙහි රොන් මඩ ඉවත් කිරීම.
3. නයාරු කළපුවෙහි මූලික පාරිසරික අධ්‍යනයන් සිදු කිරීම හා කළපුව පිරිසිදු කිරීම
4. ලංකා පටුන කළපුවෙහි මූලික පාරිසරික අධ්‍යනයන් සිදු කිරීම හා කළපුව පිරිසිදු කිරීම
5. නන්දිකඩාල් කළපුව පිරිසිදු කිරීම
6. තෝරා ගන්නා ලද කළපුවල සීමා සලකුණු කිරීම
7. තෝරා ගන්නා ලද කළපු ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
8. කළපු කළමනාකරණ කමිටු පිහිටුවීම

- තෝරාගත් කළපු තුළ මායිම් කණු සිටුවීමේ උපව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ධීවර දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂය සඳහා රු.මි. 0.751ක ප්‍රතිපාදන නිදහස් කරන ලද අතර, ඉන් රු.මි. 0.311ක ප්‍රතිපාදන මුදලක් වැය කරමින් හලාවත කළපුවෙහි මේ වන විට මායිම් කණු 283 සිටුවා ඇති අතර, තවත් කණු 141ක් සිටුවීමට ඇත. ලැමසූරිය ඇළෙහි පැතිබැම්ම සකස් කිරීමේ ව්‍යාපෘතියට අදාළ සංශෝධිත ඇස්තමේන්තුවක් ලබා දීමට කටයුතු කර ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.

- කළපු ආශ්‍රිත කළමනාකරණ කමිටු පිහිටුවීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ උපව්‍යාපෘතිය යටතේ පුත්තලම, හලාවත, නන්දිකඩාල් හා ලංකාපටුන යන කළපුවල ධීවර ප්‍රජාව සහ දිස්ත්‍රික් කාර්යාලීය නිලධාරින් දැනුවත් කිරීම සඳහා රුපියල් 775,750.00ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, පුත්තලම කළපුවේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් ධීවර දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පවත්වන ලදි. කොග්ගල හා ගරාඩුව කළපුවලට අදාළව සහ කළමනාකරණ කමිටු "ගැසට්" කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

- කළපු සංරක්ෂණය සහ කළමනාකරණය (පුත්තලම, හලාවත, කොග්ගල, ගරාඩුව) කිරීමේ උප ව්‍යාපෘතිය යටතේ හලාවත කළපුවේ කළමනාකරණ සංවර්ධන සැලැස්ම ගැසට් කිරීම සඳහා ගරු අමාත්‍යතුමන් වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු ධීවර දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත

- දේශීය නොවන SPF පසුකීටයන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ තෝරාගත් කළපු තුළ *penaeus monodon* ඉස්සන් ධාරිතාව ඉහළ නැංවීම අවශ්‍ය මූලික අධ්‍යනය සිදු කිරීමේ ව්‍යාපෘතිය ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 3.08ක මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, මේ වන විට රු.මි. 0.5 ක අත්මුදල් ප්‍රමාණයක් එම ආයතනය වෙත ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය කල්පිටිය කළපුව මූලික කරගනිමින් සිදු කරනු ලබන මෙම ව්‍යාපෘතියේ මේ වන විට අදාළ කූඩු ඉදිකිරීම සඳහා අවශ්‍ය දැල් සඳහා වන ටෙන්ඩරය ප්‍රදානය කර ඇත අතර, රසායනික ද්‍රව්‍ය මිල දී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

- ස්වාභාවික කළපු පරිසරය තුළ සිටින මව් ඉස්සන් භාවිතයෙන් කළපුවල ඉස්සන් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා පශ්චාත් කීටයන් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 2.79 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් එම ආයතනය වෙත නිදහස් කර ඇත. තෝරා ගන්නා ලද පෞද්ගලික මත්ස්‍ය අභිජනනාගාර 2ක් තුළ මත්ස්‍ය පැටවුන් නිපදවීම සිදු කරන ලදී. පළමු අදියරේ දී නිපදවන ලද ඉස්සන් පැටවුන් මිලියන 3.054ක් ප්‍රමාණයක් මඩකළපුව , රැකව හා කොග්ගල කළපුව තුළ තැන්පත් කර ඇති අතර, කළපු තුළ තැන්පත් කරන ලද පසුකීටයන්ගේ වර්ධනය සහ පැවැත්ම පිළිබඳ අධ්‍යනය කටයුතු සිදු කරමින් පවතී. ඉදිරියේ දී ආරුගම්බේ හා හලාවත යන කළපු තුළ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමට නියමිත ය.




- කළපු සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීම යටතේ පොකුරු A, B, C සහ D ලෙස තෝරාගත් පුත්තලම, හලාවත,මුන්දලම, යාපනය, තොන්ඩමනාරු, උප්පුආරු, රැකව, කොග්ගල, පානම හා ආරුගම්බේ කළපු සඳහා ප්‍රධාන සැලසුම් සකස් කර ඇත.

- කළපු කෙරෙහි සංචාරක ක්ෂේත්‍රය, වගා පාදක ජලජීවී වැනි කර්මාන්තය මෙන්ම කෙටි කාලීනව ආදායම් උත්පාදනය කළ හැකි ව්‍යාපෘති හා පරිසර සංරක්ෂණය වැනි ක්ෂේත්‍ර ඔස්සේ ද පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන වැනි ක්ෂේත්‍රයන්ගෙන් ආයෝජනය හා ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් එකී එක් එක් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි, ශක්‍යතාවක් සහිත සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් යෝජනාවලියක් සකසා ආයෝජන කැඳවීමේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් දකුණු පළාතේ රැකව, කොග්ගල හා ගරාඩුව යන කළපු 03 සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් සංවර්ධන සැලසුම් සකස් කරමින් පවතී.

- නයාරු, නන්දිකඩාල්, ආරුගම්බේ සහ ලංකාපටුන කළපු පිරිසිදු කිරීමට සැලසුම් කර කර ඇති අතර, ආරුගම්බේ කළපුව සඳහා BOQ සහ ඇස්තමේන්තු සකස් කරමින් පවතී. අනෙකුත් කළපු සඳහා පාරිසරික අනුමැතීන් ලබා ගැනීමට අදාළ කටයුතු සිදුවෙමින් පවතී.

- 2022 වර්ෂයෙහි ක්‍රියාත්මක කරන ලද ධීවර ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් වලට අදාළව අතැති බිල්පත් පියවීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මි. 102.42ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇත.

## B. <u>ධීවර වරායන් වැඩි දියුණු කිරීම හා ඉදිකිරීම</u>

**1. ගන්දර ධීවර වරාය ඉදිකිරීම**



1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන කොටස් ඉදිකිරීම සිදු කරයි.

- දියකඩනය ඉදිකිරීම (මීටර 257 )
- වේදිකාව ඉදිකිරීම (මීටර 175.63 , 221.12 හා 127 )
- වෙරළ පහසුකම් (Shore facilities) ඉදිකිරීම සිදු කරයි
  - මත්ස්‍ය වෙන්දේසි ශාලාව
  - දැල් සැකසුම් මධ්‍යස්ථානය
  - ආපනශාලා
  - සනීපාරක්ෂක පහසුකම්
  - සාප්පු ගොඩනැඟිල්ල
  - කාර්ය මණ්ඩල නේවාසිකාගාරය

- ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල නවාතැන් පහසුකම්
- පොම්පාගාර
- කසළ එකතු කිරීමේ ස්ථානය
- කිරුම් ස්ථානය
- තෙල් සැපයීම් කටයුතු සහ වතුර ටැංකි

2. ව්‍යාපෘති ආරම්භය: 2020.12.07
3. ව්‍යාපෘති අවසානය: 2023.12.06
4. ව්‍යාපෘති කාලය දින දීර්ඝ කිරීම: 2023.06.09
5. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 9,360
6. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

| අවුරුද්ද | මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. | සටහන |
|---|---|---|---|
| 2020 | 408 | 202.48 | |
| 2021 | 1,710 | 1,598.18 | |
| 2022 | 1,599.44 | 1,043.74 | |
| 2023 | 2405 | 1,267.13 | 13.09.2023 දිනට අතැති බිල්පත් රු.මි. 497.40. |

7.භෞතික ප්‍රගතිය:

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ කමිටුව (RAMP) මගින් 2023 වර්ෂයේ ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සමුද්‍රීය ඉදිකිරීම් පමණක් අඛණ්ඩව පවත්වාගෙන යාමට තීරණය කරන ලද අතර ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව ව්‍යාපෘති වැඩසටහන (Programme ) නැවත සකස් කරන ලදි.

ගන්දර ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2023.09.13 දිනට භෞතික ප්‍රගතිය 79%ක් අපේක්ෂා කළ ද එහි වත්මන් ප්‍රගතිය 71% කි.

| ව්‍යාපෘති නම සහ අයිතමයන් | අපේක්ෂිත ප්‍රගතිය (%) | ලබා ගත් ප්‍රගතිය (%) |
|---|---|---|
| **ගන්දර ධීවර වරාය** | **79** | **71** |
| මූලික කටයුතු | 100 | 100 |
| දියකඩනය ඉදිකිරීම | 95 | 94 |
| බේසම ගැඹුරු කිරිම | 87 | 83 |
| පෙර බ්ලොක් සකස් කිරිම | 100 | 100 |
| වේදිකාව ඉදිකිරීම | 72 | 56 |
| ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම | 72 | 70 |










## 2. <u>මයිලිඩ්ඩි ධීවර වරාය</u>

මයිලිඩ්ඩි ධීවර වරාය සංවර්ධනය කිරීමේ State II ව්‍යාපෘතිය 2021.10.29 දින ආරම්භ කරන ලද අතර, මූලික ඇස්තමේන්තු පිරිවැය රු.මිලි.664.1 කි.

මෙම ධීවර වරායෙහි දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කිරීම, ජැටි හා යාත්‍රා ආලෝකය, ප්‍රවේශ ඇළ මාර්ගය ඇතුළු වරාය ද්‍රෝණියෙහි මඩ කැණීම, වෙරළ පහසුකම් සැපයීම සඳහා වෙන්දේසි ශාලාව, අයිස් ගබඩාව ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම, බෝට්ටු හා එන්ජින් අලුත්වැඩියා කිරීමේ වැඩපොළ, දැල් අලුත්වැඩියා කිරීමේ ශාලාව,ගබඩා කිරීමේ ටැංකියක් සහිතව ඉන්ධන පිරවුම්හළ අලුත්වැඩියා කිරීම, ප්‍රජා ශාලාව, පරිපාලන කාර්යාලය,පරිපාලන නිලධාරීන් සඳහා නිල නිවාස, පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතලපහසුකම් ආදී ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය.

මයිලිඩ්ඩි ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි සමුද්‍රීය ඉදිකිරීම් පමණක් අඛණ්ඩව පවත්වාගෙන යාමට තීරණය කරන ලද අතර ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නැවැත්වීමට තීරණය කරන ලදී.

මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 66.5 හා අතැති බිල්පත් වටිනාකම රුපියල් මිලියන 95.155ක් වේ. භෞතික ප්‍රගතිය 84% කි. මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ අවසන් වීමට නියමිතය.






## 3. මීගමු කළපුව සංවර්ධනය කිරීම

1.ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:

මෙම ව්‍යාපෘතිය අදියර 3ක් යටතේ ක්‍රියාත්මක වේ. එහි දී, අදියර I යටතේ ක්‍රියාත්මක පැකේජ ගණන 7 කි. ව්‍යාපෘතියේ අදියර I හි පැකේජ 7 සඳහා මුළු මුදල රු.මි. 1,000 කි.

එනම්,

1. පැකේජ I - ලෙල්ලම ප්‍රදේශයේ කළපු සංවර්ධනය

   එහි දී, ලෙල්ලම වැඩබිමෙහි පැකේජ I යටතේ බෙසම හැරීම 2016.05.14 වන දින වැඩ ආරම්භ කරන ලද අතර, 2017.02.14 වන දින ව්‍යාපෘතිය අවසන් කරන ලදී.

2. පැකේජ II - උසාවි සංකීර්ණය අසල ප්‍රදේශයේ කළපුව සංවර්ධනය කිරීම

   පැකේජ II යටතේ අධිකරණය අසල කළපුව හැරීම 2017.08.01 වන දින ආරම්භ කරන ලද අතර, 2017.02.14 වන දින ව්‍යාපෘතිය අවසන් කරන ලදී.

3. පැකේජ III - රජින මාර්ගය ප්‍රදේශයේ කළපු සංවර්ධනය

   පැකේජ III යටතේ රජින පාර අසල කළපුව හැරීම 2018.07.20 වන දින ආරම්භ කරන ලද අතර, මේ වන විට කළපුවේ භෞතික ප්‍රගතිය 90% කි.

   **ප්‍රමාදවීමට හේතූන්**

   ව්‍යාපෘතියේ 3 වන අදියර ක්‍රියාත්මක කිරීමේදි, කළපු රොන්මඩ ඉවත් කර, ඒවා වියලෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර තැබීම හේතුවෙන් කඩොලාන පරිසරයට හානි සිදු කිරීමක් ලෙස දක්වා වන සංරක්ෂණ ආ. ප. 20 (1) වෙනි වගන්තිය යටතේ නඩු පවරා ඇත.

   (ව්‍යාපෘතියේ 3 වන අදියර) කළපු රොන්මඩ ඉවත් කර ඒවා වියළෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර ඇති පස් කර මීගමුව පොලීසිය නිසි ආරක්ෂාව ලබා දුන් පසු රොන්මඩ ඉවත් කිරීම නැවත ආරම්භ කිරීමට නියමිතය.

4. පැකේජ IV - ලෙල්ලම ප්‍රදේශයේ කළපු සංවර්ධනය

   ලෙල්ලම වැඩබිමෙහි පැකේජ IV යටතේ බෙසම හැරීම 2019.03.26 වන දින වැඩ ආරම්භ කරන ලද අතර, මේ වන විට කළපුවේ භෞතික ප්‍රගතිය 100% ක් වේ.

5. පැකේජ V - ලෙල්ලම ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම

   පැකේජ V යටතේ මීටර 15 පළල මීටර 265 ක් දිග ජැටිය ඉදිකරනු ලබයි. මේවන විට ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛනය සකස් කරමින් පවතී.

6. පැකේජ VI - රජින මාර්ගය ප්‍රදේශය අසල ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම

   පැකේජ VI යටතේ ජැටිය ඉදිකරනු ලබයි. මේවන විට ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛනය සකස් කරමින් පවතී.

7. පැකේජ VII - උසාවි සංකීර්ණය අසල ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම

   පැකේජ VII යටතේ මීටර 15ක් පළල මීටර 145ක් දිග ජැටියක් ඉදිකරනු ලබයි. මේ වන විට සැලසුම් සකස්කිරීම අවසන් කර ඇති අතර, ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛනය සකස් කරමින් පවතී. මේ වන විට කොන්ත්‍රාත් කරුවෙකු තොරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නියමිතය.

**4. ශක්‍යතා අධ්‍යනය, සැලසුම් සකස් කිරීම හා පාරසරික බලපෑම් අධ්‍යනය කිරීම**

- අම්බලන්ගොඩ ධීවර වරාය වැඩි දියුණු කිරීම.

  ශක්‍යතා අධ්‍යනය හා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් අධ්‍යනය කිරීම සඳහා උපදේශන සමාගමක් තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදනය අවසන් කර ඇත.

- හික්කඩුව ධීවර වරාය වැඩි දියුණු කිරීම.

  ශක්‍යතා අධ්‍යනය හා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් අධ්‍යනය කිරීම සඳහා උපදේශන සමාගමක් තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදනය අවසන් කර ඇත.

- වාලච්චේන ධීවර වරාය සංවර්ධනය කිරීම

  ශක්‍යතා අධ්‍යනය හා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් අධ්‍යනය කිරීම සිදු කරමින් පවතී.

- දොඩංදූව ධීවර වරාය වැඩිදියුණු කිරීම

  ශක්‍යතා අධ්‍යනය හා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් අධ්‍යනය කරමින් පවතී.

**C. වැඩ අවසන් කර භාර දී ඇති ව්‍යාපෘති විස්තරය**

**1. වෙල්ලමන්කර ධීවර වරාය ඉදිකිරීම**

වෙල්ලමන්කර ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි වටිනාකම රු.මි. 2,498ක් වන අතර, පහත අංගයන්ගෙන් සමන්විත මෙම වරායෙහි කාර්යයන් අවසන් කර, මෙහෙයුම් කටයුතු සඳහා ධීවර වරාය නිතීගත සංස්ථාව වෙත භාරදී ඇත.

- දියකඩනය (මීටර 567 )
- බාදන වාරකය (Groyne) ඉදිකිරීම (මීටර 125)
- වේදිකාව ඉදිකිරීම (මීටර 350)
- වෙරළ පහසුකම් (Shore facilities) : මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, ආපනශාලා, සනීපාරක්ෂක පහසුකම්, සාප්පු ගොඩනැඟිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල නවාතැන් පහසුකම් සහ පානීය ජල ටැංකි.






## 2. කලමැටිය ධීවර වරාය ඉදිකිරීම

කලමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014.07.14 වන දින ආරම්භ කරන ලද අතර, දැනට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 100%ක් වේ. මෙම ව්‍යාපෘතියේ මූලික වටිනාකම රු.මි. 1,280.79 කි.

මෙම ධීවර වරායේ මූලික කොන්ත්‍රාත්තුවේ නොමැති එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වැඩවලට අදාළ ඉදිකිරීම් සිදු කර මෙහෙයුම් කටයුතු සඳහා ධීවර වරාය නීතිගත සංස්ථාවට භාරදී ඇත.

## 3. මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම

මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020.10.20 වන දින ආරම්භ කරන ලද අතර, මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති වටිනාකම රු.මි. 379.8 කි. 260 m දිගැති දියකඩනයකින් සමන්විත මෙම නැංගුරම්පොළ ඉදිකිරීමේ කාර්යයන් අවසන් කරන ලද අතර, මෙහි මෙහෙයුම් කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.





(මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම් ව්‍යාපෘතියේ දියකඩනය ඉදිකිරීම් භෞතික ප්‍රගතිය 100 % කි).

## 4. රැකව නැංගුරම්පොළ ඉදිකිරීම

රැකව නැංගුරම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020.10.20 වන දින ආරම්භ කරන ලද අතර, මෙම ව්‍යාපෘතියේ සංශෝධිත ව්‍යාපෘති වටිනාකම රු.මි. 490කි. බාදන වාරකයක් (Groyne) හා 300m දිගැති දියකඩනය ඉදිකිරීමකින් සමන්විත මෙම නැංගුරම්පොළ ඉදිකිරීමේ කාර්යයන් අවසන් කරන ලද අතර, මෙහි මෙහෙයුම් කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.





(රැකව නැංගුරම්පොළ ඉදිකිරීම ඉදිකිරීම් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 100% කි).





දකුණු පළාතේ කිරින්ද, හම්බන්තොට, කුඩාවැල්ල, ගන්දර, ගාල්ල, මිරිස්ස, බේරුවල, මරදාන, පැරුලිය, දොඩන්දූව සහ පාණදුර යන ධීවර වරායන් හා ධීවර තොටුපොළවල පවතින අඩුපාඩු සියල්ල සම්පූර්ණ කරන ලෙස ලැබුණු උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කර තිබේද යන්න පිළිබඳ පසුවිපරම් කිරීමේ සාකච්ඡාව.





2023.02.02 දින පැරැලිය ධීවර වරායේ සංවර්ධන කටයුතු පිළිබඳව සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවක නිරත වීම



## විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ජපන් රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | මුදල ඇ.ඩො. | වර්ථමාන ප්‍රගතිය |
| උතුරු හා නැගෙනහිර පලාත්වල ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.<br>(Providing supportive equipment for fisheries industry) | 3,000,000 | අංක NPD/AGC/PP/FIS/2023/05 යටතේ 2023.07.04 දිනැති ලිපිය මගින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලැබී ඇත.<br><br>අදියර 2ක් යටතේ උපකරණ ලබා දීමට නියමිතය.<br><br>පළමු අදියර යටතේ ධීවර කටයුතු ප්‍රවර්ධනය සහ ශීත කටයුතු වලට අදාළ ව පහත උපකරණ ලබාදීම සිදුකරනු ලබයි.<br>- Ice Making Machine<br>- Digital Platform Scale<br>- Fishing Net, Refrigerator<br>- Cargo Truck<br>- Prefabricated Refrigerator/ Freezer<br>මීට අදාළ යෝජනාව 2023 සැප්තැම්බර් මස ජපාන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.<br><br>දෙවන අදියර යටතේ ධීවරයින්ගේ ආරක්ෂාවට අදාළව පහත උපකරණ ලබාදීම සිදුකෙරේ.<br>- Patrol Boat<br>- Rigid Hull Inflatable Boat (RIB)<br>- Lighted Buoy<br>- HF Radio Transceiver<br>මීට අදාළ යෝජනාව 2024 පෙබරවාරි මස ජපාන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.<br><br>(ජපාන මූල්‍ය වර්ෂය අප්‍රේල් සිට මාර්තු දක්වා ක්‍රියාත්මක වේ, එබැවින් එය එම මුදල් වර්ෂය සඳහා වන ව්‍යාපෘතියකි). |

| චීන රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | මුදල රු.මිලි | වර්ථමාන ප්‍රගතිය |
| 1. ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණ ධීවරයින් සඳහා ධීවර දැල් සැපයීම. | 500 | අංක NPD/PP/AGC/FIS/2023/07 යටතේ, 2023.08.08 දිනැති ලිපිය මගින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ද, අංක ER/CN/HEF/G/01 යටතේ, , 2023.09.06 දිනැති ලිපිය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) අනුමැතියද ලැබී ඇත. |
| 2. උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත්වන අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා නිවාස පහසුකම් සංවර්ධනය සඳහා ආධාර සැපයීම | 750 | |
| 3. ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල තෝරාගත් කුඩා පරිමාණ ධීවරයින් සඳහා සහල් ලබා දීම.. | 555.4 | |

| තායිලන්ත රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | මුදල රු.මි | වර්ථමාන ප්‍රගතිය |
| සාගර විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණුව සහ විශේෂඥ සේවය | 54 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 13.09.2023 දින අනුමැතිය ලබාදී ඇත. |

| ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | මුදල ඇ.ඩො. | වර්ථමාන ප්‍රගතිය |
| ශ්‍රී ලංකාවේ වඩාත් අවදානමට ලක්විය හැකි දිස්ත්‍රික්කවල අඩු පහසුකම් සහිත ධීවර ප්‍රජාවගේ හදිසි ආහාර සහ පෝෂණ ආරක්ෂණ අවශ්‍යතා සපුරාලීම. | 1.018 | 2023.02.17 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD)අනුමැතිය.<br>කොළඹ, කළුතර, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්කවලින් මෝටර් රහිත සම්ප්‍රදායික බෝට්ටු හිමි අඩු පහසුකම් සහිත ධීවරයින් 5058ක් සඳහා මුදල් හුවමාරුව සම්පූර්ණ කරන ලදී. |
| ඵලදායී ජෛව ආරක්‍ෂාව සහ ඩිජිටල් තාක්‍ෂණය තුළින් බුද්ධිමත් සහ තිරසාර ජලජීවී වගාව | 1.2 | 2022.10.27 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD)අනුමැතිය.<br>ජෛව ආරක්ෂාව (BS) සහ විශාල දත්ත (BD) පිළිබඳව තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) ස්ථාපනය කිරීම. |
| මුහුදු කුඩැල්ලන් ජලජීවී වගාව සහ ක්ෂය වූ වන සම්පත් සැකසීම, නැවත ගබඩා කිරීම සහ කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය | 200,000 | 2022.10.20 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD) අනුමැතිය. |
| ධීවර කර්මාන්තයේ පසුඅස්වනු හානි අවම කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම | 7.8 | නවීකරණය කරන ලද බහුදින යාත්‍රාව සාර්ථක අත්හදා බැලීම් දෙකක් සිදු කර ඇත |

## අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූල වෙනත් කටයුතු

### දේශීය ටින්මාළු කර්මාන්තයේ වර්ධනය

දේශීය ටින් මාළු අවශ්‍යතාවය සපුරාලීම සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන මෙන්ම විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ටින් මාළු වර්ග යොදා ගැනේ. 2020 වසරට පෙර වසර 05ක දත්ත සලකා බැලීමේදී ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව සාමාන්‍යයෙන් රු.මිලියන 10,000ට වඩා වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් වැයකර ඇති බව වාර්තා වේ. මෙම වැය වන ඉතා විශාල විදේශ විනිමය ප්‍රමාණය මෙන්ම දේශීය ටින් මාළු කර්මාන්තය නංවාලීමෙන් රට තුළ උත්පාදනය වන රැකි රක්ෂා ප්‍රමාණය සැලකිල්ලට ගෙන මෙරට ටින් මාළු නිෂ්පාදනය නංවාලීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් පසුගිය වසර කිහිපය පුරාවට නොයෙකුත් ක්‍රියාමාර්ගයන් ගනිමින් සිටී.

මෙහි එක් ප්‍රධාන ක්‍රියාමාර්ගයක් ලෙස මෙරට ටින් මාළු කර්මාන්තය සඳහා දේශීය වශයෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමට අපහසු අවස්ථාවලදී එම අමුද්‍රව්‍ය සඳහා අවශ්‍ය මැකරල් මසුන් විශේෂිත බදු සහන යටතේ ආනයන කිරීමට අවසර ලබාදී ඇත.

2019 වසරට පෙර මෙම අමාත්‍යාංශයේ ධීවර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචිව පැවති ටින් මාළු කර්මාන්තශාලා ගණන 6ක් පමණ වූ අතර එය මේ වන විට 16 දක්වා වර්ධනය වී ඇත. එසේම මෙම අමාත්‍යාංශයේ ධීවර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි මෙම ටින් මාළු කර්මාන්තශාලා මගින් මෙම වසරේ මුල් කාර්තුව තුළ පමණක් ටින් මාළු මෙ.ටො.2500ක් පමණ (එනම් කෑන් මිලියන 6ක් පමණ) නිෂ්පාදනය කර ඇති අතර මෙම ප්‍රමාණය 2019 වසර තුළම නිෂ්පාදිත සමස්ත ටින් මාළු ප්‍රමාණයට ආසන්න අගයකි. එසේම මෙම දේශීය ටින් මාළු නිෂ්පාදන ප්‍රමාණය වැඩි වීම ටින් මාළු ආනයනය සඳහා වැය වන විදේශ විනිමය අඩුකර ගැනීම සඳහා රුකුලක් වී ඇති අතර මේ හේතුවෙන් 2022 තුළ ටින් මාළු ආනයනය මෙ.ටො.3431 ක් දක්වා අඩු වී ඇති අතර ඒ සඳහා වැය වී ඇති විදේශ විනිමය ප්‍රමාණය රු.මිලියන 2671.9ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.





ඔලුවිල් ධීවර වරායට ගොඩබාන මත්ස්‍ය තොග අතුරින් අතිරික්ත මත්ස්‍ය තොග භාවිතා කරමින් ටින් මාළු කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමට ටෙස් පෞද්ගලික සමාගම හා ගිවිසුමක් අත්සන් කිරීම 2023.02.07 වන දින අමාත්‍යාංශයේදී සිදුවිය.

## එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ අනතුර හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුව ඇති හානි සඳහා වන්දි ලබාදීම.

2021.05.21 දින එක්ස්ප්‍රස් පර්ල් නෞකාව මෙරට මුහුදු සීමාව තුළදී ගිනිගෙන මුහුදුබත් වීම හේතුවෙන් නැවෙහි වූ බහාලුම්වල පැවති ප්ලාස්ටික්, තෙල්, රසායනික ද්‍රව්‍ය ආදිය මුහුදු පරිසරයට එකතු වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ සමුද්‍රීය පරිසර පද්ධතියට දැඩි හානි සිදු විය. මෙම පාරිසරික හානි හේතුවෙන් කළුතර සිට මීගමුව දක්වා ප්‍රදේශයේ ධීවරයින්ගේ, ධීවර ආම්පන්න සහ බෝට්ටුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ධීවර තහනම් කලාපයක් පැනවීමට රජය විසින් පියවර ගන්නා ලදී. මෙම හේතුවෙන් ජීවිකාව අහිමි වූ ධීවරයින් සඳහා අදාළ නැව් සමාගමෙන් වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන ලදී.

මෙහිදී ශ්‍රී ලංකා රජය විසින් අදාළ නැව් සමාගමෙන් වන්දි මුදල් සඳහා ඉල්ලීම් සිදුකර ඇති අතර, අදාළ නාවුක රක්ෂණ සමාගම විසින් අතුරු වන්දි මුදල් ලෙස මේ වනවිට රුපියල් මිලියන 3,068ක මුදලක් ලබා දී ඇත. මෙම වන්දි මුදල් සෘජු ලෙස රැකියාවේ යෙදෙන ධීවරයින් 15,032 දෙනෙකු සඳහා ද, ධීවර ආශ්‍රිත රැකියාවල නිරත වන පුද්ගලයින් 4,888 දෙනෙකු සඳහා ද ප්‍රදානය කිරීමට කටයුතු සලසා ඇත. මෙම නෞකා අනතුර මඟින් ධීවර ක්ෂේත්‍රයට සිදු වූ පාරිසරික හානිය සම්බන්ධව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) විසින් පත්කළ විද්වත් කමිටුවක් මඟින් කටයුතු කරනු ලබන අතර, එම කටයුතු සඳහා ද අමාත්‍යාංශයේ සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) සහයෝගය ලබාදෙන ලදී.









එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ හානියෙන් විපතට පත් ධීවර කාර්මිකයින් සඳහා සිව්වන අදියරේ වන්දි මුදල් ලබාදීම 2023.05.11 වන දින අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී පැවැත්විය.

# 02
# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)

## දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම

## මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම

## අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසර සංවර්ධනය.
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- පසුඅස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
- අන්තර් ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම.
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම.
- මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ග ගත ක්‍රමයට ධීවර ප්‍රජාවට හා අනෙකුත් සේවාදායකයින්හට ප්‍රශස්ත සේවාවක් ලබාදීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම.

## ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම.
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යෙදවුම් සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයනය සඳහා ස්වස්ථ සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවිකිරීම හා අධීක්ෂණය
- ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම හා නියාමනය
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවලදී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවෙමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය හා විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මඟින් ධීවර සමාජ ආරක්ෂණය
- කළපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර ගම්මානවල යටිතලපහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

# 01. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - 2023

## 1.0 සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබසාධක තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

### 1.1 ධීවර සංවර්ධන අංශයේ මූලික කාර්ය භාරය

- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම
- වෙරළාශ්‍රිත ඉදි කිරීම් ව්‍යාපෘතිවලට අදාළව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා ධීවර කර්මාන්තයන්ට බාධාවක් නොවන පරිදි නිර්දේශ ලබාදීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාළ යටිතලපහසුකම් සංවර්ධනය
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ධීවර කාර්මික රක්ෂණය ක්‍රියාත්මක කිරීම.
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.
- ධීවර වන්දි ලබා දීම පිළිබඳ කටයුතු කිරීම.
- දියවර කැකුළු ළමා ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කළපු පරිසර පද්ධතිය සංවර්ධනය හා සංරක්ෂණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය කිරීම.
- විශේෂ ධීවර ගැටලු නිරාකරණය කිරීම.

### 1.2 ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම


**වගුව 01: ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සම්බන්ධ කාර්යයන්වල ප්‍රගති**

| කාර්යය | 2023.08.31 දක්වා ප්‍රගතිය |
|---|---|
| රක්ෂණය කරන ලද සමස්ත ධීවර යාත්‍රා සංඛ්‍යාව | 25073 |
| රක්ෂණය කරන ලද සමස්ත ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 44977 |
| ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව | 69049 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම් | 21934 |
| ධීවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම් | 63 |
| ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම් | 17 |

### 1.2.1 ධීවර යාත්‍රා රක්ෂණය කිරීම

ධීවර යාත්‍රා රක්ෂණය කිරීම 1980 ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ නියෝග අනුව යාන්ත්‍රික ධීවර යාත්‍රා සඳහා අනිවාර්යයෙන් සිදුකළ යුතුය.

ඒ අනුව 2014 සිට 2023 අගෝස්තු මස 31 දක්වා ධීවර යාත්‍රා රක්ෂණය කිරීමේ ප්‍රගතිය සන්සන්දනාත්මකව පහතින් දක්වා ඇත.





**Graph 01:** රක්ෂණය කරන ලද ධීවර යාත්‍රා සංඛ්‍යාව

### 1.2.2 ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීම

2023 අංක 01 දරන යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත්වීමේ හා පැමිණීමේ නියෝග අනුව බහුදින ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයන් රක්ෂණය කිරීම අනිවාර්ය කර ඇත. මීට පෙර එය නීතියක් බවට පත්ව නොතිබුණ අතර වර්තමානයේ බහුදින යාත්‍රා සඳහා එය අනිවාර්ය වී ඇත.

ඒ අනුව 2014 සිට 2023 අගෝස්තු මස 31 දක්වා ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීමේ ප්‍රගතිය සන්සන්දනාත්මකව පහතින් දක්වා ඇත.




**Graph 02:** රක්ෂණය කරන ලද ධීවර කාර්මිකයින් සංඛ්‍යාව

### 1.2.3 ධීවර රැකුම නව රක්ෂණාවරණය හඳුන්වාදීම.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. මෙරට ධීවර කර්මාන්තය සැලකීමේදී කරදිය ධීවර අංශයේ අවදානම මිරිදිය ධීවර අංශයට වඩා ඉහළ අගයක් ගනී. ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 315,720ක් වන අතර මින් 225,070ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටින අතර ඉන් 87%ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර 34,300ක් බහු දින ධීවර යාත්‍රා වලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරත වේ .මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 266,640ක් වන අතර සෘජු ධීවර කර්මාන්තයෙන් යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000ක් පමණ වේ .එමෙන්ම මෙම අංශයට සම්බන්ධ වක්‍ර රැකියාවෙ නිරත වන හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 03ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත ජන ගහණයෙන් 18% ක් පමණ පිරිසක් සිය ජීවනෝපාය සලසා ගන්නේ ධීවර කර්මාන්තය ආශ්‍රිතවය.

ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රියාකාරී ධීවර කාර්මිකයින් ප්‍රමාණය 315,720කි. මේ අතුරින් මෙතෙක් ක්‍රියාත්මකව පැවති රක්ෂණ යෝජනා ක්‍රමයට දායක වූ පිරිස, ක්‍රියාකාරී ධීවර කාර්මික සංඛ්‍යාවන් ආසන්නව ගත් කළ 1.73% ක ප්‍රමාණයකි. පැවති රක්ෂණ යෝජනා ක්‍රමයේ අඩුපාඩු හා ගැටලු හඳුනාගෙන ධීවර කාර්මිකයින් සඳහා වඩාත් ඵලදායි හා සහනදායී වාරික මුදලකින් යුත් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍යතාව පැනනැගී ඇති බැවින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එක්ව "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන "ධීවර රැකුම" පුද්ගල හදිසි අනතුරු රක්ෂණය යටතේ ධීවර කාර්මික මහතාගේ අභාවයකදී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මුදල යැපෙන්නන් වෙත ලබා දෙන අතර මුළු මුදලින් අඩක් බිරිඳටත් අනෙක් කොටස පවුලේ බාලවයස්කාර දරුවන් අතර බෙදී යා යුතුය. රක්ෂණ සංස්ථාව මඟින් විකල්ප ක්‍රම 03ක් හඳුන්වා දී ඇත.

**වගුව 02: ධීවර රැකුම රක්ෂණාවරණයේ ආවරණ විස්තර**

| ආවරණ විස්තර | රක්ෂිත මුදල (රු) | | |
|---|---|---|---|
| 01. පුද්ගල හදිසි අනතුරු රක්ෂණය | විකල්ප 01 | විකල්ප 02 | විකල්ප 03 |
| හදිසි අනතුරු රක්ෂණය | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවය | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| සදාකාලික අර්ධ අකර්මන්‍යතාවය | 600,000 | 750,000 | 1,000,000 |
| 02. අතුරුදහන්වීම සඳහා | | | |
| ධීවර කටයුතුවල නිරත වී සිටියදී සිදුවන හදිසි අනතුරක් හේතුවෙන් ධීවර මහතාගේ අතුරුදහන් වීමකදී ප්‍රතිලාභ ගෙවීම අතුරුදහන් වී මාස 05ක් ගත වූ පසු ආරම්භ කරනු ලබයි. | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා | මසකට 7,500 බැගින් මාස 12ක් දක්වා |
| වසරකට වැඩි කාලයක් අතුරුදහන් වී ගත වුවහොත් රක්ෂිත මුදලින් ඉහත ගෙවනු ලැබූ වන්දි මුදල අඩු කළ පසු ඉතිරිය ගෙවනු ලබයි. | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| 03. රෝහල් ගතවීමේ දීමනාව<br>හදිසි අනතුරු හෝ අසනීප සඳහා රෝහල් ගතවීම් වලදී එක් ධීවර පවුලකට වර්ෂයකට උපරිම දින 14ක් සඳහා හිමිකම් ගෙවනු ලබයි.<br>ධීවරයා හා කලත්‍රයා .අවු -18 සිට 65 දක්වා<br>අවිවාහක, රැකියා විරහිත ළමුන් අවු.-21 දක්වා | දිනකට රු.500=/ (උපරිම දින 14) | දිනකට රු.500=/ (උපරිම දින 14) | දිනකට රු.500=/ (උපරිම දින 14) |

| | | | |
|---|---|---|---|
| 04. අධ්‍යාපන වියදම් දීමනාව<br>පාසල් යන දරුවන්ගේ අධ්‍යාපන වියදම් සඳහා උපරිම දරුවන් දෙදෙනෙකු සඳහා මසකට රු.1000 බැගින් වර්ෂයක් සඳහා ගෙවනු ලැබේ. | 1,000 | 1,000 | 1,000 |
| 05. අවමංගල්‍යාධාර ප්‍රතිලාභය (ස්වභාවික මරණ හේතුවෙන් පමණක් ගෙවනු ලබයි.) | 200,000 | 200,000 | 200,000 |
| 06. ගුවන් ටිකට් පත් ආවරණය<br>ධීවර මෙහෙයුම් හේතුවෙන් වෙනත් රටකට ගසාගෙන යෑම / අත්අඩංගුවට පත්විමකදී | 40,000 | 40,000 | 40,000 |



**Figure 01:** ධීවර රැකුම නව රක්ෂණාවරණය

### 1.2.4 ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම.

මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධ ව රජයේ සෘජු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අයකිරීමක් සිදු නොකරයි. මේ යටතේ ධීවර කටයුතුවල යෙදී සිටියදී සිදුවන ස්වාභාවික ආපදාවන් හේතුවෙන් මියයන ධීවර කාර්මිකයෙකු සඳහා ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක වන්දි මුදලක් ලබාදෙනු ලබයි. 2023 වසර තුල ප්‍රතිලාභී පවුල් 3ක් සඳහා වන්දි ලබාදී ඇත. මෙහිදී එම මරණය සිදු වීම ස්වභාවික ආපදා තත්ත්වයක් යටතේ සිදුවූ බව තහවුරු කළ යුතුය. ඒ සඳහා ආපදා සිද්ධි වාර්තාවක් ලබා දීම අනිවාර්ය වේ.

### 1.2.5 දියවර දිරිය ණය යෝජනා ක්‍රමය

නව තාක්ෂණය හඳුන්වා දිම තුළින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරිමත් ගුණාත්මක තත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනීමත් අරමුණු කර ගනිමින්, ධීවර යාත්‍රා වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුව සමග එක්ව දියවර දිරිය අඩු පොලී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබාදෙන අතර පොලී අනුපාත පහත පරිදි වේ.

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණය ලාභියාගෙන් අය කරන පොලී අනුපාතය 5%
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණය ලාභියාගෙන් අය කරන පොලී අනුපාතය 7%
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොලී සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමයට ලබා දේ.
- ධීවර යාත්‍රාංගණ වැඩි දියුණු කිරීම්, අඩි 55ට වැඩි ධිවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරිම්(RSW, CSW),මරුවැල් පන්න හා වින්ච් සවි කිරිම් සඳහා ණය ලබා දිමේදි ප්‍රමුඛතාව ලබා දේ.
- දියවර දිරිය අදියර එක යටතේ ප්‍රතිලාභීන් 261 දෙනෙකු සඳහා රුපියල් 783569388.00 ණය මුදලක් ලබා දී ඇති අතර දියවර දිරිය අදියර දෙක යටතේ ප්‍රතිලාභීන් 755ක් සඳහා රුපියල් මිලියන 1000කට අධික ණය මුදලක් ලබා දී ඇත.

මේ වන විටත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහි 4% ක පොලී වාරික මුදල් ලංකා බැංකුව වෙත යොමු කරන අතර එය 2027 වන තෙක් ගෙවීම් සිදු කිරීමට ඇත.

### 1.2.6 දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. අතිබහුතරයක් ධීවර කාර්මිකයින්ගේ පවුල්වල ආර්ථිකය සම්පූර්ණයෙන්ම එම පවුලේ ප්‍රධානියා වන ධීවරයා උපයන ආදායම මත රඳාපවතී . එම ධීවර පවුල්වල පෝෂණය ,අධ්‍යාපනය ,සෞඛ්‍ය ආරක්ෂිතභාවය ද සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ ද ධීවරයාගේ තනි ආදායම මතය .ධීවර කාර්මිකයාට සිදුවන අනතුරු නිසා එම පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටීමක් සිදුවන අතර මෙහිදී ප්‍රධාන වශයෙන් ධීවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය බිඳවැටීම බහුලව පෙන්නුම් කරයි .ඒ අනුව ධීවර පවුල්වල සමාජ ආරක්ෂණය තහවුරු කිරීමටත් ,ධීවර කර්මාන්තයට තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීමටත්, ධීවරයින් තම පවුලේ අනාගතය වෙනුවෙන් ආයෝජන/ඉතිරිකිරීම් පුරුද්දක් ඇති කිරීම හා අරපිරිමැස්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව ළමුන් සඳහා වඩාත් පුළුල් ආවරණයක් ලබාදීම සඳහා ධීවර අමාත්‍යංශයේ ඉල්ලීම මත ලංකා බැංකුව විසින් ධීවර ළමුන් සඳහාම විශේෂිත වූ ‘දියවර කැකුළු’ ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.





**Figure 02:** දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම

**2023 වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ එහි ප්‍රගතිය**

## 1.3 ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන පිටත එන්ජිම සහිත කුඩා යාත්‍රා (OFRP) හා පාරම්පරික යාන්ත්‍රික යාත්‍රා (MTRB), ධීවර යාත්‍රා සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ භූමිතෙල් ලබාදීමේ වඩසටහන 2023. [OFRP (Out board fiber Reinforced Plastic Boat), MTRB (Mechanized Traditional Boat)]

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවේ ප්‍රයෝජනය සඳහා ආධාර වශයෙන් පිරිනැමුණු ඉන්ධන එම යාත්‍රා හිමියන් සඳහා නොමිලේ ලබාදීමේ වැඩසටහන 2023.05.23 දින පාණදුර ධීවර වරායේදී ධීවර අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා, ධීවර රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා සහ මහජන චීන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති ගරු කී ෂෙන්හොංග් (Qi Zhenhong) මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූහ.

චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවේ පරිභෝජනය සඳහා ආධාර වශයෙන් පිරිනැමුණු ඩීසල් ලීටර මිලියන 3.79 වෙනුවට සී/ස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කුඩා පරිමාණ ධීවරයින්ගේ පරිභෝජනය සඳහා භූමිතෙල් ලබාදීමට තීරණය කරන ලද අතර එවකට පැවති මිල අනුව භූමිතෙල් ලීටර මිලියන 4.32ක් නිදහස් කිරීමට හැකියාව පවතින බව නිරීක්ෂණය විය. මෙම ඉන්ධන නිකුත් කිරීම අදියර දෙකක් යටතේ සිදුකරනු ලබන අතර පළමු අදියරේදී ලීටර 75ක් හා දෙවන අදියරේදී ලබා දීමට හැකි ඉන්ධන ප්‍රමාණය ගණනය කිරීම් සිදු කරමින් පවතින අතර ඉදිරියේදී ඒ පිළිබඳ දැනුම් දීමට නියමිතය.

එමගින් ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, දිවයින පුරා OFRP හා MTRB යාත්‍රා 27,000ට පමණ මේ සඳහා එම සහනය ලබා දීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, කල්මුණේ, මඩකළපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චි, යාපනය, මුලතිව්, මන්නාරම, පුත්තලම, හලාවත හ මීගමුව යන ධීවර දිස්ත්‍රික්ක 15හි මේ වනවිට සක්‍රීය ධීවර යාත්‍රා ලෙස හඳුනාගත් යාත්‍රා 25564 ක් සඳහා එම සහනය ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.

මෙම ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 96ක් මගින් සිදුකරනු ලබන අතර එක් යාත්‍රාවකට ලීටර් 75 බැගින් OFRP හා MTRB යාත්‍රා 24181ක් සඳහා භූමිතෙල් ලීටර් 1,813,575 පළමු අදියරෙහි ඉන්ධන නිකුත් කිරීම මේ වනවිට අවසන් කර ඇත.

දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.








**Figure 03:** චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවට ආධාර වශයෙන් පිරිනැමුණු ඉන්ධන එම යාත්‍රා නොමිලේ ලබාදීමේ වැඩසටහන 2023.05.23 දින පානදුර ධීවර වරායේදී පැවැත්වූ අයුරු

**1.4 යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා හිමියන් (NTRB) වෙත ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන.**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඩු අදායම්ලාභී ධීවර කාර්මිකයින් වෙත සහන සැලසීමේ අරමුණින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා අතරින් එක් යෝජනාවක් වන NTRB යාත්‍රා හිමියන් වෙත මාස තුනක කාලයක් සඳහා ජීවනාධාරයක් ලබා දීමේ වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වීමට එකගත්වය පළ විය. ඒ අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අදියර දෙකක් යටතේ මුළු ප්‍රතිලාභීන් 11,794ක් සඳහා ජීවනාධාරය ලබා දෙන ලදී. මෙහි පළමු අදියර යටතේ මඩකළපුව,යාපනය, මුලතිව්,කිලිනොච්චි, කල්මුණේ හා ත්‍රිකුණාමලය යන

දිස්ත්‍රික්කවල යාන්ත්‍රික නොවන පාරම්පරික යාත්‍රා හිමියන් 6,947ක් වෙත එක් ප්‍රතිලාභියෙකුට රුපියල් 42$ බැගින් මාස 03ක කාලයක් සඳහා ජීවනාධාරය ලබාදීම සිදු කරන ලදී.

මෙහි දෙවන අදියර යටතේ හලාවත,කොළඹ,මන්නාරම,පුත්තලම,ගාල්ල,කළුතර,මාතර,මීගමුව හා තංගල්ල යන දිස්ත්‍රික්කවල යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා හිමියන් 4,847ක් වෙත එක් ප්‍රතිලාභියෙකුට රුපියල් 47$ බැගින් මාස 03ක කාලයක් සඳහා ජීවනාධාරය ලබා දීම සිදු කරන ලදී.

**1.5 ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බටහිර පර්යන්තය සංවර්ධනය සඳහා වැලි ලබා ගැනීම හේතුවෙන් ධීවර කාර්මිකයන්ට සිදුවූ බලපෑම අවම කිරීම)**

කොළඹ වරාය බටහිර පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අදාළ ධීවර කාර්මිකයන්ට සිදුවූ බලපෑම අවම කිරීම සඳහා ධීවර කර්මාන්තයේ යටිතලපහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන එකසිය හතළිහක මුදලක් ධීවර අමාත්‍යාංශය වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා බටහිර පර්යන්ත සංවර්ධන සමාගම මඟින් වෙන් කර ඇත.

මේ වනවිට එම මුදලින් රුපියල් මිලියන 70ක මුදලක් ධීවර අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර එම මුදල් මෙම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන ගම්පහ හා කොළඹ දිස්ත්‍රික්ක වල ධීවර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා යෙදවීමට නියමිතය. ඒ සඳහා සුදුසු ව්‍යාපෘති මේ වනවිට හඳුනාගනිමින් පවතී.

**1.6 මැයි මස 21 වන දින සිදු වූ New X Press Pearl භාණ්ඩ ප්‍රවාහන නෞකාව ගිනිගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රගතිය**

ඉන්දියාවේ හසිරා වරායේ සිට නයිට්‍රික් අම්ලය මෙට්‍රික් ටොන් 25ක්, තවත් රසායනික ද්‍රව්‍ය, රූපලාවන්‍ය ද්‍රව්‍ය කිහිපයක්, බංකර් ඔයිල් මෙට්‍රික් ටොන් 278ක් සහ සමුද්‍ර වායු තෙල් මෙට්‍රික් ටොන් 50ක් සමඟ කන්ටේනර් 1,486ක් රැගෙන යමින් තිබූ සිංගප්පූරු ධජය සහිත MV Xpress Pearl භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාව 2021 මැයි මස 20 දින ශ්‍රී ලංකාවේ වෙරළට කිලෝමීටර් 9.5ක් ඔබ්බෙන් නැංගුරම් ලා තිබියදී ගිනි ගන්නා ලදි. එමඟින් ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනික කාන්දුවීම් හේතුවෙන් රටේ බටහිර වෙරළ තීරයේ ධීවර කර්මාන්තයට සැලකිය යුතු ආර්ථික හානියක් සිදුවිය. කළුතර සිට මීගමුව දක්වා වෙරළබඩ ප්‍රදේශයේ තෙල්, රසායනික ද්‍රව්‍ය සහ පිළිස්සුනු අංශු විශේෂයෙන් ප්ලාස්ටික් කැබලි වලින් වෙරළ තීරය දූෂණය වීම නිරීක්ෂණය වී ඇත. ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනික කාන්දු වීම වෙරළබඩ ධීවර කර්මාන්තයට සහ සාගර පරිසර පද්ධතිවලට ඉහළ ඍණාත්මක බලපෑමක් ඇති කරන ලදි.

මෙම අනතුර කොරල්පර, මුහුදු තණකොළ, මත්ස්‍ය වාසස්ථාන ආදී සමස්ත පරිසර පද්ධතියටම බරපතල බලපෑම් එල්ල කරන බව විශේෂඥයෝ පැවසූහ. එබැවින් MV Xpress Pearl යාත්‍රාවේ බලපෑම පුළුල් වන අතර කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලපෑම් ඇති කිරීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජීය සහ ආර්ථික සහ සෞඛ්‍ය අංශ කෙරෙහි කාලීන බලපෑම් ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන ධීවර අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගෙන ඇති අතර, හානියේ අහිතකර බලපෑම් අවම කර ගැනීමට සහ ධීවරයින් සහ මුහුදු ආහාර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. ඒ අනුව මීගමුව,කළුතර සහ කොළඹ ධීවර දිස්ත්‍රික්කවල ධීවර ක්ෂේත්‍රයට ක්ෂණික අහිතකර බලපෑම් අවම කරගැනීම සඳහා ධීවර කටයුතු තහනම් කරන ලදී.තාවකාලික මත්ස්‍ය තහනම 2021-05-21 දින පනවා ඇති අතර එය නාරා ආයතනයේ විද්‍යාත්මක නිර්දේශ මත පදනම්ව 2022-06-05 දක්වා ක්‍රියාත්මක විය.

MV Xpress Pearl හි දූෂක සහ සුන්බුන් හේතුවෙන් පරිසර දූෂණය වීමට එරෙහිව පූර්ව ආරක්ෂණ පියවරක් ලෙස සංඛ්‍යාත්මක ආකෘති අධ්‍යනයන් මත පදනම්ව දූෂක පැතිරීමේ හැකියාව හඳුනාගනිමින්, NARA විසින් කිලෝමීටර් 65ක වෙරළ තීරයේ වර්ග කිලෝමීටර් 457ක අක්වෙරළ ප්‍රදේශයක් තහනම් කිරීමට නිර්දේශ කරන ලදි. උතුරේ මහඔය ගං මෝය සහ දකුණේ පාණදුර මසුන් ඇල්ලීම තහනම් ලෙස ප්‍රකාශ කරන ලදි. ප්‍රදේශයේ දීර්ග කාලයක් තිස්සේ පැවති මත්ස්‍ය තහනම හේතුවෙන් ඍජු ධීවරයින් සහ ධීවර කර්මාන්තයේ වක්‍ර ප්‍රතිලාභීන් සැලකිය යුතු පිරිසක් මෙම සිද්ධියෙන් පිඩාවට පත්වී ඇති අතර එසේ පිඩාවට පත් පාර්ශ්වයන් ලෙස ධීවරයින් කාණ්ඩ 23ක් සහ ධීවර කර්මාන්තයට සම්බන්ධ වෙනත් වෘත්තීන් වර්ග 24ක් හඳුනාගෙන ඇත.

**වගුව 03 : බලපෑමට ලක්වූ ඍජු ධීවරයින් පිළිබඳ තොරතුරු**

| දිස්ත්‍රික්කය | ඍජු බලපෑමට ලක්වූ ධීවර පරීක්ෂක කොට්ඨාශ සංඛ්‍යාව | සක්‍රිය ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | බලපෑමට ලක්වූ ධිවර යාත්‍රා |
|---|---|---|---|
| මීගමුව | 13 | 11,081 | IMUL 40<br>IDAY 60<br>OFRP 2015<br>NTRB 1484<br>MTRB 02 |
| කොලඹ | 10 | 3,250 | IMUL 11<br>IDAY 14<br>OFRP 446<br>NTRB 294<br>MTRB 01 |
| කළුතර | 02 | 701 | OFRP 47<br>NTRB 33 |

**බහුදින ධිවර යාත්‍රා (IMUL), එක්දින ධිවර යාත්‍රා (1 Day) පිටත එන්ජින් සහිත එක්දින ධිවර යාත්‍රා (OFRP), පාරම්පරික ධිවර යාත්‍රා (NTRB), යාන්ත්‍රිකරණය කල (MTRB)**

## 1.6.1 ධීවර අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද වන්දි ප්‍රමාණය

**වගුව 04 : ඍජු ධීවරයින් සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණ**

| දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබා දුන් වන්දි ප්‍රමාණය (රුපියල් ) | | | |
|---|---|---|---|---|---|
| | | 1 වන අදියර | 2 වන අදියර | 3 වන අදියර | 4 වන අදියර |
| මීගමුව | 11,081 | 206,197,500.00 | 242,825,000.00 | 551,220,000.00 | 700,000,000.00 |
| කොලඹ | 3,250 | 58,942,500.00 | 74,720,500.00 | 205,233,125.00 | 277,053,608.00 |
| කළුතර | 701 | 14,170,000.00 | 16,312,500.00 | 37,285,000.00 | 70,000,000.00 |
| රු. 5000 දීමනාව වෙනුවෙන් | | 67,000,000.00 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| දැල් ආම්පන්න සඳහා | | 2,067,515.00 | | | 4,474,410.00 |
| ජලජීවී වගාවන්ට සිදු වූ හානි පූරණය | | | 1,154,930.00 | | |
| එකතුව | | 348,377,515.00 | 335,012,930.00 | 793,738,125.00 | 1,051,528,018.00 |

**වගුව 05: වක්‍ර ධීවරයින් සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණ**

| දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වන්දි ගෙවීමට අදාළ තොරතුරු සම්පූර්ණ කරන ලද වන්දිලාභීන් සංඛ්‍යාව | ලබා දුන් වන්දි ප්‍රමාණය (රු) |
|---|---|---|---|
| මීගමුව | 3,866 | 3,072 | 588,601,048.00 |
| කොළඹ | 851 | 709 | 143,548,608.00 |
| කළුතර | 171 | 153 | 35,131,600.00 |
| | 4,888 | 3,934 | 767,281,256.00 |

**වගුව 06: වක්‍ර ධීවරයින් සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු**

| | වක්‍ර කාණ්ඩය | අනුමත වන්දි අනුපාත | ගම්පහ දිස්ත්‍රික්කය | | කොළඹ දිස්ත්‍රික්කය | | කළුතර දිස්ත්‍රික්කය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | වන්දි ගෙවන්නන්ගේ මුළු සංඛ්‍යාව | ගම්පහ දිස්ත්‍රික්කය සඳහා මුළු වන්දි මුදල - රු | වන්දි ගෙවන්නන් ගණන | කොළඹ දිස්ත්‍රික්කය සඳහා අනුමත වන්දි මුදල (රු.) | වන්දි ගෙවන්නන් ගණන | කළුතර දිස්ත්‍රික්කය සඳහා අනුමත වන්දි මුදල |
| 1 | කරවල කම්කරුවන් | 98,000.00 | 808 | 79,184,000.00 | - | - | | |
| 2 | වාහන භාවිතා කරන කරවල වෙළෙඳුන් | 280,000.00 | 1 | 280,000.00 | - | - | 1 | 280,000.00 |
| 3 | කරවල වෙළෙඳුන් | 238,000.00 | 136 | 32,368,000.00 | 1 | 238,000.00 | 3 | 714,000.00 |
| 4 | එන්ජින් අලුත්වැඩියා කරන්නන් | 76,328.00 | 1 | 76,328.00 | 1 | 76,328.00 | | |
| 5 | ෆයිබර්ග්ලාස් අලුත්වැඩියා කරන්නන් | 196,000.00 | 21 | 4,116,000.00 | 3 | 588,000.00 | | |
| 6 | මාළු කපන්නන් | 113,680.00 | 39 | 4,433,520.00 | 121 | 13,755,280.00 | 20 | 2,273,600.00 |
| 7 | මාළු වෙළඳුන් (පාර අයිනේ කුඩා කඩ) | 280,000.00 | 330 | 92,400,000.00 | 61 | 17,080,000.00 | 30 | 8,400,000.00 |
| 8 | ධීවර දැල් සහ උපාංග අලෙවිකරුවන් | 140,000.00 | 3 | 420,000.00 | 1 | 140,000.00 | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | ඉස්සන් සැකසීම සඳහා සහායකයින් | 98,000.00 | 29 | 2,842,000.00 | - | - | | |
| 10 | ලෙල්ලම හි උදව්කරුවන් | 22,400.00 | 78 | 1,747,200.00 | - | - | | |
| 11 | අයිස් බෙදාහරින්නන් (කුඩා පරිමාණ) | 91,000.00 | 5 | 455,000.00 | 4 | 364,000.00 | 2 | 182,000.00 |
| 12 | ගොඩබෑමේ සහායකයින් | 98,000.00 | 403 | 39,494,000.00 | 45 | 4,410,000.00 | 1 | 98,000.00 |
| 13 | පොකිරිස්සන් එකතු කරන්නන් | 280,000.00 | 7 | 1,960,000.00 | 3 | 840,000.00 | 4 | 1,120,000.00 |
| 14 | ජංගම මාළු වෙළෙන්දන් (බයිසිකල් සහ යතුරුපැදි භාවිතා කරමින් විකිණීම) | 224,000.00 | 46 | 10,304,000.00 | 416 | 93,184,000.00 | 58 | 12,992,000.00 |
| 15 | නෙට් මෙන්ඩර්ස් | 49,000.00 | 5 | 245,000.00 | 5 | 245,000.00 | | |
| 16 | අනිකුත් | 98,000.00 | 5 | 490,000.00 | 2 | 196,000.00 | | |
| 17 | කුඩා පරිමාණ කරවල නිෂ්පාදකයින් | 280,000.00 | 462 | 129,360,000.00 | 1 | 280,000.00 | 22 | 6,160,000.00 |
| 18 | සිල්ලර විකුණුම්කරුවන් (සාප්පු) / කුඩා පරිමාණ මාළු වෙළෙන්දන් | 280,000.00 | 540 | 151,200,000.00 | 24 | 6,720,000.00 | 5 | 1,400,000.00 |
| 19 | කුඩා පරිමාණ මාළු තොග අලෙවිකරුවන් | 280,000.00 | 86 | 24,080,000.00 | 15 | 4,200,000.00 | | |
| 20 | කුඩා පරිමාණ ආහාර සැපයුම්කරුවන් | 168,000.00 | 37 | 6,216,000.00 | 2 | 336,000.00 | | |
| 21 | කුඩා පරිමාණ ඉන්ධන සපයන්නන් | 224,000.00 | 4 | 896,000.00 | 4 | 896,000.00 | | |
| 22 | තොග වෙළඳුන් | 336,000.00 | 7 | 2,352,000.00 | - | - | 2 | 672,000.00 |
| 23 | ජාඩි මාළු නිෂ්පාදකයින් | - | - | - | - | - | 5 | 840,000.00 |
| | | | 3,053 | 584,919,048.00 | 709 | 143,548,608.00 | 153 | 35,131,600.00 |

### 1.7 ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීම.

ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය විසින් සිදු කරනු ලබයි.

2023 ජනවාරි 01 සිට 2023 අගෝස්තු 31 දක්වා සංවර්ධන අංශය විසින් නිකුත් කර ඇති ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

නිකුත්කර ඇති මුළු ධීවර හැඳුනුම්පත් සංඛ්‍යාව - 1300
නිකුත්කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව -1003

**1.8 වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහණය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය**

ධීවර අමාත්‍යතුමාගේ හා රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟපෙන්වීම් හා උපදෙස් මත ධීවර ක්ෂේත්‍රයට අදාළව වෙරළාසන්න සමුද්‍රීය පරිසර පද්ධතිය, සමුද්‍රීය ජෛව විවිධත්වය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරලීම උදෙසා සමුද්‍රීය ජෛව විවිධත්වය ඉහළ නැංවීම සඳහා වෙරළාසන්න මුහුදු පත්ළෙහි කෘත්‍රිම උපස්ථර මත මත්ස්‍ය අභිජනන ස්ථාන ඇතිකිරීම අරමුණු කර ගෙන 2021,2022 සහ 2023 වර්ෂ වල භාවිතයෙන් ඉවත් කළ බහුදින ධීවර යාත්‍රා සහ බස්රථ සැකිලි විශාල ප්‍රමාණයක් පරිසරයට හානියක් නොවන සේ සාගරයේ තැන්පත් කර කෘත්‍රිම උපස්ථරයක් ලෙස යොදා ගැනීම සිදුකරන ලදි. 2023 වර්ෂය තුළ එම ව්‍යාපෘතිය යටතේ යාපනය දිස්ත්‍රික්කය දෙවන අදියර ක්‍රියාවට නන්වන අයුරු පහත ඡායාරූප මඟින් පෙන්නුම් කරයි.



**Figure 04. 2023 වර්ෂය තුල යාපනය දිස්ත්‍රික්කයේ දෙවන අදියර යටතේ බස් රථ ගිල්වීමට සූදානම් කරන අයුරු දැක්වෙන ඡායාරූප**

**1.9 කළපු සංවර්ධනය (සංවර්ධන අංශය)**

**1.9.1 පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම කළපුව ගැසට් කිරීම.**

2010 අගෝස්තු 4 වන දින අංක 1665/17 දරන අංක යටතේ පුත්තලම කළපුව කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2013 අංක 35 දරන සංශෝධිත ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුව පුත්තලම කළපු පරිසර පද්ධතියේ සංරක්ෂණ, සංවර්ධන හා කළමනාකරණය හා ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා නැවත GPS පාඨාංක සහිතව ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සිදු කරමින් පවතී.

**1.9.2 පුත්තලම කළපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටු රැස්වීම පවත්වන ලදි**

ඒ අනුව, 2013 අංක 35 දරන 1996 අංක 2 දරන සංශෝධිත පනතට අනුව ධීවර හා ජලජ සම්පත් පනතට අනුව 31(අ) ප්‍රකාරව පුත්තලම කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශයේ සංරක්ෂණය, කළමනාකරණය, ආරක්ෂාව හා පාලනය බලාත්මක කර පවත්වාගෙන යාම සඳහා පුත්තලම සහ-සහභාගිත්ව කමිටුව 2023.01.17 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.



**Figure 05.** **පුත්තලම කලපු ධීවර කළමනාකරණ සහ-සහභාගිත්ව කමිටු රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූප**

**1.9.3 පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදි.**

2023 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම කළපුවේ කළපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 2023 ජූලි 31 සහ අගෝස්තු 09,10 යන තෙදින තුළ පවත්වන ලදි.



**Figure 06:** **පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන අයුරු දැක්වෙන ඡායාරූප**

**1.9.4 හලාවත කොග්ගල හා ගරාඬුව යන කළපුවල ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කෙරෙමින් පවතී.**

ගාල්ල දිස්තික්කයේ කොග්ගල කළපුවත්, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගරාඬුව කළපුවත් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි පුත්තලම කළපුවත් එම කළපු පරිසර පද්ධතියේ පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් ඒ තුළින් කළපුව ආශ්‍රිතව සිදුකරන්නාවූ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීමට නියමිතය.

**1.9.5 මහවැව දිස්ත්‍රික්කයේ හලාවත කළපුවේ මායිම් කණු සිටුවීම.**

මහවැව දිස්ත්‍රික්කයේ හලාවත කළපුවේ මායිම් කණු 283ක් 2023.03.30 සිට 2023.04.18 දක්වා කාලය අතරතුර සිටුවා අවසන් කර ඇත.

**1.9.6 හලාවත කළපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.**

හලාවත කළපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ අරමුණින් හලාවත කළපුව ආශ්‍රිතව පවතින ඉස්සන් ගොවිපලවල්වල අවසාදිත පොකුණු අධීක්ෂණය ධීවර අමාත්‍යාංශය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව සිදු කරන ලදි.

## 2.0 කළමනාකරණ අංශය

### 2.1 ධීවර හා ජලජ සම්පත් තිරසර ලෙස කළමනාකරණය

ධීවර හා ජලජ සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරිම හා විධිමත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, ඒ සඳහා ධීවර යාත්‍රා, ධීවර මෙහෙයුම් වෙනුවෙන් කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම්, නිත්‍යානුකූල නොවන, අවිධිමත්, වාර්තා නොවන ධීවර කටයුතු වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම් සිදු කරන අතර 2023 වර්ෂයට අදාලව පහත සඳහන් පරිදි විවිධ ධීවර මෙහෙයුම් හා යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දී ඇත.

**වගුව 07: 2023 වර්ෂයේ 2023.08.31 දිනට අදාළව එක් එක් කාර්යයන්හි ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | අපේක්ෂිත ඉලක්කය | 2023.8.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | ධීවර යාත්‍රා ලියාපදිංචිය (නව) | 2,000 | 3,880 |
| 2 | මහ මුහුදේ යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම | 1,020 | 1,312 |
| 3 | යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම. | 500 | 859 |
| 4 | විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 25 | 24 |
| 5 | විසිතුරු මසුන් අපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 30 | 31 |
| 6 | විසිතුරු මසුන් ප්‍රතිඅපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 15 | 15 |
| 7 | කටු පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | 80 | 40 |
| 8 | කටු පොකිරිස්සන් ළඟ තබාගැනීම,ප්‍රවාහනය | 10 | 14 |
| 9 | හක්බෙල්ලන් ඇල්ලීම සඳහා බලපත්‍ර ලබාදීම | 50 | 0 |
| 10 | හක්බෙල්ලන් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම | 80 | 47 |
| 11 | හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | 40 | 23 |

| | | | |
|---|---|---|---|
| 12 | මුහුදු කූඩැල්ලන් ඇල්ලීම, එකතු කිරිම, ළඟ තබා ගැනීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම | 200 | 166 |
| 13 | මුහුදු කූඩැල්ලන් ආනයනය, අපනයනය, ප්‍රති අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | 150 | 121 |
| 14 | සිප්පි කටු එකතු කිරීම ප්‍රවාහනය සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 20 | 21 |
| 15 | කෘතීම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 4 | 0 |
| 16 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම | 200 | 124 |
| 17 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදනඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම | 150 | 126 |
| 18 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම | 13 | 7 |
| 19 | නව යාත්‍රා සඳහා ලියාපදිංචි අංක වෙන්කිරීම, අනුමත කිරීම සහ නිකුත් කිරීම | IMUL-100 | 59 |
| | | OFRP-1000 | 721 |
| | | MTRB-250 | 178 |
| | | NTRB-500 | 400 |
| | | NBSB--0 | 0 |
| 20 | නක්ලා (Operculum of ***Chicoreusramosus***) අපනයනය කිරීම සඳහා බලපත්‍රය | 15 | 11 |
| 21 | නක්ලා (Operculum of ***Chicoreusramosu***s) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 15 | 15 |
| 22 | ***Chicoreusramosus*** මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 30 | 13 |
| 23 | ***Chicoreusramosus*** මාංශ අපනයන බලපත්‍රය | 15 | 8 |
| 24 | අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 20 | 16 |
| 25 | මුහුදු තෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 8 | 17 |
| 26 | මුහුදු තෘණ ආනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම. | | 0 |
| 27 | මුහුදු තෘණ ප්‍රති- අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | | 0 |
| 28 | ලොග් පොත් නිකුත් කිරීම | 1,000 | 1,136 |

## 3.0 තත්ත්ව පාලන අංශය

### 3.1 තත්ත්වපාලන අංශය මගින් මත්ස්‍ය අපනයනයේදි අදාල ප්‍රමිතින් පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

මත්ස්‍ය අපනයනය මගින් සැලකිය යුතු විදේශ විනිමයක් ලබා ගැනීමේ අවකාශය පවතින අතර එහිදි මත්ස්‍ය නිෂ්පාදනවල ප්‍රමිතින් පවත්වා ගැනීම වැදගත් වේ. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්වපාලන අංශය මගින් මත්ස්‍ය අපනයනයේදී අදාළ ප්‍රමිතින් පවත්වා ගැනීමට අදාලව බලපත්‍ර නිකුත් කිරීම් සහ එම ආයතන පරීක්ෂා කිරීම් සිදු කරන අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

ඒ අනුව තත්ත්වපාලන අංශයේ ලියාපදිංචි මුළු ආයතන සංඛ්‍යාව 85වේ.ඉන් ආයතන 44 ක් යුරෝපා කොමිසමට අයත් රටවල් වලට අපනයනය සඳහා අවසර ලබා දී ඇති උසස් තත්වයේ ආයතන වේ.

**වගුව 08: 2022 වර්ෂයේ 2022.06..31 දිනට අදාලව මත්ස්‍ය තත්ත්ව පාලන කටයුතුවල ප්‍රගතිය**

| කාර්යය | | වාර්ෂික ඉලක්කය | ප්‍රගතිය 08.31 දිනට | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| **දේශීය වෙළඳපොළෙහි ඇති මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | | |
| 01.වරාය පරීක්ෂණ සිදු කිරීම. | | 18 | 1 | - |
| 02.මත්ස්‍ය වෙන්දේසි පොළවල් සහ පොදු මත්ස්‍ය වෙළඳ සැල් පරීක්ෂණ සිදු කිරීම. | | 5 | - | - |
| 03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ධීවර කාර්මිකයන්/වෙළෙඳුන්) | | 10 | 10 | 100% |
| **අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | | |
| 01.නිල සාම්පල ලබා ගැනීම - ආයතන | | 400 | 54 | 40% |
| 02.දැනුවත් කිරීමේ වැඩසටහන් (තත්ත්ව පාලන නිලධාරීන් /අදාළ ක්ෂේත්‍ර නිලධාරීන්) | | 10 | 2 | 20% |
| 03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ජලජීවි වගාකරුවන්/ පිරිසැකසුම් ආයතන නිලධාරීන් / ධීවර කාර්මිකයන්) | | 10 | - | - |
| 04.ධිවර වරාය වල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ පරීක්ෂාකිරීම. | | 36 | 3 | 8% |
| 05.ධිවර යාත්‍රාවල වල සෞඛ්‍යාරක්ෂිතභාවය, සනීපාරක්ෂක තත්ත්ව හා යහපත් පරිහරන ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම. | | 100 | 9 | 9% |
| 06.අපනයනය සඳහා මත්ස්‍ය පිරිසැකසුම් සිදුකෙරෙන ආයතන පරීක්ෂාව. | සිදුකිරීමට අපේක්ෂිත ආයතන පරීක්ෂා සංඛ්‍යාව | 167 | 36 | 22% |
| | සිදුකිරීමට අපේක්ෂිත ඇසුරුම් /පොකිරිස්සන් එකතු කරන මධ්‍යස්ථාන පරීක්ෂා සංඛ්‍යාව | 15 | 4 | 26% |
| 07.රසායනාගාර පරීක්ෂා කටයුතු සිදු කිරීම. | | 6 | 2 | 33% |
| 08.අභිජනන මධ්‍යස්ථාන, මිරිදිය ජලජීවි වගා ගොවිපල සහ කිවුල්දිය, සමුද්‍රජීවී වගාබිම් පිළිබඳ පරීක්ෂා කිරීම. | | 40 | 1 | 2.5% |

<table>
<tr><td colspan="2">09.ජලජීවී වගා රසායන අවශේෂ පිළිබඳ සිදුකරන රසායනාගාර පරීක්ෂණ</td><td>යුරෝපා කොමිසම සහ එක්සත් රාජධානිය මඟින් නිර්දේශිත සැලැස්මට අනුකූලව වාර්ෂිකව තීරණය වේ.</td><td>0</td><td>-</td></tr>
<tr><td colspan="2">කාර්යය</td><td>වාර්ෂික ඉලක්කය</td><td>ප්‍රගතිය 08.31 දිනට</td><td>ප්‍රතිශතය %</td></tr>
<tr><td colspan="2">10. ගොඩබෑමේදී/ පිරිසැකැස්මේදී ඉන්ද්‍රීය විභාජක පරීක්ෂා</td><td>70</td><td>6</td><td>8.6%</td></tr>
<tr><td colspan="2">11. කලාපිය ධිවර කළමනාකරණ සංවිධානයන් මගින් ස්ථාපිත සංඛ්‍යාලේඛන දත්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</td><td>අවස්ථානුකූව</td><td>0</td><td>-</td></tr>
<tr><td colspan="2">12. අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන් සඳහා නිල සාම්පල වැඩසටහන අනුව සිදුකළ පර්යේෂණ ප්‍රතිඵළ ප්‍රමිතීන්ට අනුකූල නොවන අවස්ථා සඳහා ගනු ලබන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම.</td><td>ප්‍රතිඵල වල පාරාමිතීන්ගේ සම්මත අගයන් ඉක්මවා යාම සිදු වුවහොත් අවස්ථානුකූව</td><td>5</td><td>-</td></tr>
<tr><td colspan="2">13. ආනයනික රටවල් (Importing countries) මඟින් මත්ස්‍ය නිෂ්පාදනවල නුසුදුසුතා පිළිබඳව සිදුකරන දැනුම් දීම.</td><td>අදාල රටවලින් නුසුදුසුතා දැනුම් දෙන වාර ගණන අනුව අවස්ථානුකූව</td><td>9</td><td>-</td></tr>
<tr><td rowspan="2">14. අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.</td><td>නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.</td><td rowspan="2">75</td><td>0</td><td>-</td></tr>
<tr><td>මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම.</td><td>43</td><td>57%</td></tr>
<tr><td colspan="2">15. මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.</td><td>25000</td><td>13250</td><td>53%</td></tr>
<tr><td colspan="2">16. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා රටවල් සඳහා)</td><td>25000</td><td>16905</td><td>67%</td></tr>
<tr><td colspan="2">17. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා නොවන රටවල් සඳහා)</td><td>15000</td><td>7775</td><td>51.8%</td></tr>
<tr><td colspan="2">18. ප්‍රති අපනයනය සඳහා ආනයනය කරන ලබන මත්ස්‍ය තොග පිළිබඳව පරීක්ෂණසිදු කිරීම. (BIA)</td><td>ප්‍රති අපනයනය සඳහා මසුන් ආනයනය කිරීමට ඉල්ලීම් කිරීමත් අනුමැතීන් ලබා දීමත් මත අවස්ථානුකූව</td><td>1</td><td>-</td></tr>
<tr><td colspan="2">19. යුරෝපා කොමිසම සහ අනෙකුත් රටවල අදාළ නිසි බලධාරී ආයතන (Competent Authorities) සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා ආනයනික රටවල් මගින් සිදුකරන දැනුම්දීම් මඟින් හෝ විදේශවල පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් කෙරෙන විමසීම්.</td><td>සිදු කරන ඉල්ලීම් අනුව අවස්ථානුකූව</td><td>96</td><td>-</td></tr>
</table>

## 4.0 විමර්ශන හා පුහුණු අංශය

### 4.1 ධීවර ප්‍රජාව, ධීවර නිලධාරී හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ මනා සබඳතාවයක් ගොඩනැගීම.

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නීති විරෝධී, අවිධිමත් හා වාර්තා නොවන ධීවර කටයුතු වලින් තොරව, ධීවර සම්පතෙහි තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම විමර්ශන අංශයේ ප්‍රමුඛතම අරමුණ වේ.

නව තාක්ෂණය යොදා ගනිමින් ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව සම්පත් කළමනාකරණය තුළින් ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබා දීම සඳහා ධීවර කර්මාන්තය තිරසර ලෙස සංවර්ධනය කිරීමත් අරමුණ වේ.

අනාගත පරපුර සඳහා ධීවර සම්පත් ආරක්ෂා කර ගැනීම උදෙසා ධීවර ප්‍රජාව, ධීවර ක්ෂේත්‍රය නියාමනය සිදු කරන ධීවර නිලධාරීන් සහ ධීවර ක්ෂේත්‍රයට අදාළවන අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙහි පුහුණු අංශයේ කාර්ය භාරය වේ.

**වගුව 09: විමර්ශන හා පුහුණු අංශය - 2023 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් මට්ටමේ වැටලීම් සහ නීති විරෝධී ධීවර කටයුතු වලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතු සුපරීක්ෂණය | නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක | 4 |
| 02 | පරිපාලන දඩ පැනවීම සඳහා සියලු දිස්ත්‍රික් කාර්යාල වලින් යොමු වන ඉල්ලීම්, අදාල ක්‍රියාවලියට අනුව , ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පරිපාලන දඩ පැනවීමේ ක්‍රමවේදය සකස් කිරීම. | | 24 |
| 03 | තහවුරු වන නීති විරෝධී කටයුතු වලට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම. | | 5 |
| 04 | යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද නීති කඩ කිරීම සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම. | | 161 |
| 05 | විශේෂ වැටලීම් සිදු කිරීම. | 9 | 7 |
| 06 | ධීවර යාත්‍රා,ධීවර අම්පන්න,නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු. | | |
| | 1.පරීක්ෂාවන් ගණන | 40 | 20 |
| | 2.නඩු පැවරීම් ගණන | නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක | 0 |
| 07 | සියලු දිස්ත්‍රික් කාර්යාල,ධීවර පරීක්ෂක කාර්යාල, ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ වරාය කාර්යාල පරීක්ෂණ සහ විමර්ශන කටයුතු. | 3 | 5 |
| 08 | අදාළ පාර්ශ්වකරුවන්(stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම. | 3 | 4 |
| 09 | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම | 8 | 25 |
| 10 | දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ධීවර කාර්මික දැනුවත් කිරීම් සංවිධානය කිරීම. | 10 | 7 |

| | | | |
|---|---|---|---|
| 11 | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බාහිර ආයතන වල පැවැත්වෙන පුහුණු වැඩසටහන්/ පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා පාඨමාලා වෙත යොමු කිරීම. | 4 | 12 |
| 12 | විශ්ව විද්‍යාල /කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සම්බන්ධ බාහිර අධීක්ෂක ලෙස ක්‍රියා කිරීම. | 0 | 1 |
| 13 | පුහුණු වැඩසටහන් සම්බන්ධ ප්‍රතිපෝෂණය හා විශ්ලේෂණය. | 7 | 2 |

## 5.0 තොරතුරු තාක්ෂණ අංශය

### 5.1 අරමුණ

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ධීවර සම්පත් කළමනාකරණය කිරීම සඳහා මාර්ගගත යෙදුමක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමයි. දෙපාර්තමේන්තු ජාලය නඩත්තු කිරීම, මාර්ගගත යෙදුම් පද්ධතිය ක්රියාත්මක කිරීම, අදාළ දෘඩාංග හැසිරවීම, පුළුල් දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම, තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පුහුණුව ප්‍රධාන අවධානය යොමු කළ යුතු අංශ වේ.

### 5.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- දෙපාර්තමේන්තු සේවා දායකයන් තුළ දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
- දෙපාර්තමේන්තු ජාලය සහ මූලික තොරතුරු තාක්ෂණය පිළිබඳ නිලධාරී පුහුණුව.
- ඊ- ලොග් පද්ධතියේ භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ඊ කණ්ඩායම් අධීක්ෂණය සහ සහාය දීම.
- ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) අධීක්ෂණය, සහාය සහ පුහුණුව.
- ගතික වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- දත්ත විශ්ලේෂණය සඳහා R භාෂාවේ භාවිතය වැඩි දියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා දෘඩ පද්ධතිය නඩත්තු කිරීම.
- කාර්යමණ්ඩල පාදක නිරීක්ෂක පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තු පරිගණක දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කිරීම.
- විවෘත මෙහෙයුම් පද්ධතිය සහ යෙදුම හඳුන්වා දීම.
- R සංඛ්‍යා ලේඛනය පිළිබඳ නිලධාරීන් 20 දෙනෙක් පුහුණු කිරීම.
- නව යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය හඳුන්වාදීම හා එය බහුදින යාත්‍රා 4150කට පමණ සවිකර අවසන් කිරීම. ප්‍රධාන කාර්යාලයෙන් සහ ධීවර කාර්යාලවලින් නිරතුරුව එය අධීක්ෂණය කිරීමේ කටයුතු සැලසීම.

5.3 දෙපාර්තමේන්තුවේ සේවාවන් ජාලගත මෘදුකාංගය මගින් ක්‍රියාත්මක කිරීම.




Figure 07: නිලවෙබ් අඩවිය

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය සංවර්ධනය කරනුයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 30කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීමටයි.

ධීවරයින් ලියාපදිංචි කිරීම, බෝට්ටු ලියාපදිංචි කිරීම, විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාමයන් ඊට ඇතුළත්ය. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගයට ප්‍රධාන අංග දෙකක් ඇත, ඇන්ඩ්‍රොයිඩ් යෙදුම සහ ජාවා යෙදුම එම ප්‍රධාන අංගයන් වේ. ජාවා යෙදුම දැනට දෙපාර්තමේන්තු සර්වර් පද්ධතිය තුළක්‍රියාත්මක වන අතර එය http://msdfar.com භාවිතයෙන් ප්‍රවේශවිය හැකිය. ඇන්ඩ්‍රොයිඩ් යෙදුම දැනටමත් ස්මාර්ට් උපාංග 500කට වඩා ස්ථාපනය කර ඇති අතර අනුවාද යාවත්කාලීන කිරීම් කිහිපයක් සිදු කර ඇත. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය භාවිතා කරමින් ධීවරයින් 42000 ක්, යාත්‍රාංගන 99ක් (පැරණි දත්ත ඇතුළුව), බෝට්ටු 7000කට වැඩි ප්‍රමාණයක්, නියමුවන් 7300ක් දැනටමත් ලියාපදිංචි කරඇති අතර මෙහෙයුම් බලපත්‍ර 7000කට වැඩිප්‍රමාණයක් නිකුත්කර ඇත. 2022 වර්ෂය සඳහා මාර්ගගත පිටත්කිරීමේ පද්ධතිය හරහා මාර්ගගත පිටත්කිරීම් 107000කට වැඩිප්‍රමාණයක් සිදුකරන ලදී. මෙම ක්‍රියාවලිය 2021 වර්ෂයේ සිට අඛණ්ඩව සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ හොඳම ජාලගත මෘදුකාංගය ලෙස MSDFAR පද්ධතිය සඳහා ජාලගත මෘදුකාංග භාවිතා කරන රාජ්‍ය ආයතන තේරීමේ තරගාවලියෙන් රන් පදක්කමක් හිමි විය.

5.4 දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය

. **[www.fisheriesdept.gov.lk](www.fisheriesdept.gov.lk)**.




Figure 08: නිලවෙබ්අඩවිය

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය දිනපතා යාවත්කාලීන වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම තමන්ගේම පිටුවක් ඇති අතර එහි එම අංශය වගකිවයුතු ක්‍රියාකාරකම් ඇතුලත් කර තිබේ. නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන වේ. සියලුම ලියාපදිංචි අපනයනකරුවන්, ආනයනකරුවන්, අංගන සහ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව වෙබ් අඩවිය තුළ පවත්වාගෙන යනු ලබන අතර එය යාවත්කාලීන වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශය හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේම සියලුම පද්ධතිවලට ප්‍රවේශ විය හැකිය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හොඳම සිංහල වෙබ් අඩවිය සඳහා රන් පදක්කම සහ 2020 හොඳම වෙබ් තරගයේ හොඳම රජයේ වෙබ් අඩවිය සඳහා කුසලතා ත්‍යාගය ද දිනාගත්තේය.

5.5 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංගය භාවිතය පිළිබඳ ඇගයීම.

දෙපාර්තුමේන්තු ජාලගත මෘදුකාංග (MSDFAR) පද්ධතිය භාවිතා කරමින් සිය රාජකාරීන් ඉටු කළ නිලධාරීන් සඳහා ඇගයීමක් ලෙස ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ අතර ඉන් වැඩි ලකුණු ලබාගත් නිලධාරීන් සඳහා දිරිගැන්වීමක් ලෙස නවතම වර්ගයේ ටැබ්ලට් යන්ත්‍ර ලබාදෙන ලදි. ඒ මගින් සියලුම නිලධාරීන් මෙම පද්ධතිය ඔස්සේ රාජකාරී ඉටු කිරීමට යොමු කරවන ලදි.

5.6 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංග භාවිතය පිළිබඳව නිලධාරී පුහුණුව.

ධීවර දිස්ත්‍රික්ක 15හි මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන ආකාරය වෙන වෙනම නිරීක්ෂණය කරන අතර ඒ සඳහා අප අංශයේ නිලධාරීන් කැපවී සිටිති. ඔවුන්ට ඇතිවන ගැටලු කඩිනමින් ඉටුකරන අතර පුහුණුවක් අවශ්‍ය බව දන්වන ලද සියලුම දිස්ත්‍රික්ක සඳහා පුහුණුවීම් පවත්වන ලදි.

5.7 SLCERT සමඟ දෙපාර්තමේන්තුවේ සේවාදායකයන් සහ ජාල මෘදුකාංගවල ආරක්ෂක තක්සේරුවක් සිදු කිරීම.




Figure 09: SLCERT මඟින් ආරක්ෂක තක්සේරුවක් සිදු කිරීම.

සර්වර් පද්ධතියෙහි සහ යෙදුම්වල ඇති අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය දෙපාර්තමේන්තුවේ සේවාදායකයන්, ජාලමෘදුකාංග සහ සියලුම දෙපාර්තමේන්තුවේ ඇන්ඩ්‍රොයිඩ් යෙදුම පිළිබඳ ආරක්ෂක තක්සේරුවක් සංවිධානය කෙරුණි.

## 5.8 ඊ- ලොග් පද්ධතියේ භාවිතය වැඩිදියුණු කිරීම.





**Figure 10:** ඊ- ලොග් පද්ධතිය

මෙහෙයුම් අංශයේ සම්බන්ධීකරණයෙන් තොරතුරු තාක්‍ෂණ අංශය වරාය 23ක කාර්යාල සියල්ලටම ඊ-ලොග් පද්ධතිය හඳුන්වා දී ඇත. එදිනෙදා මසුන් ඇල්ලීමේදී ඊ-ලොග් ක්‍රමය භාවිතයෙන් දත්ත ලබා දීම සාර්ථකව සිදුවන අතර මීට අමතරව සෑම වරායක් සඳහාම ලොග් පිටු දත්ත ඇතුළත් කිරීම සඳහා මෙම පද්ධතිය ලබා දී ඇත. මේ වන විට මෙය සාර්ථකව සිදුකරන අතර දැනට වසර 2 ක මසුන් ඇල්ලුම් දත්ත වාර්තා සකස් කරන ලද්දේ ඊ-ලොග් පද්ධතියෙන් ලබාගත් දත්ත භාවිතා කිරීමෙනි. ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOCT) සඳහා දත්ත වාර්තා කිරීම සිදු කරනුයේ ඊ-ලොග් පද්ධතිය මගින් ලබාගත් දත්ත භාවිතා කිරීමෙනි.





Figure 11: ලේඛන කළමනාකරණ පද්ධතිය

5.9 ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) අධීක්ෂණය, සහාය සහ පුහුණුව.

තොරතුරු තාක්ෂණ අංශය විසින් ලේඛන කළමනාකරණ පද්ධතිය (Doxpro) සාර්ථකව මිලදීගෙන ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානීන්ට ලිපි කළමනාකරණ පද්ධතිය (Doxpro) පිළිබඳ මූලික පුහුණුවක් ද ලබා දී තිබේ. ඔවුන්ගේ යෝජනාවට හා අවශ්‍යතාවයට අනුව තොරතුරු තාක්ෂණ අංශය විසින් ලිපි කළමනාකරණ පද්ධතිය (Doxpro) මිලදීගෙන ආයතන වෙත යොමුකර ඇත.

5.10 ගතික වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.





**Figure 12:** ගතික වාර්තාකරණ පද්ධතිය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අනාගත ඉලක්ක සැලසුම් කිරීමට , අස්වැන්න පුරෝකථනයට සහ එදිනෙදා තීරණ ගැනීම සඳහා දත්ත විශාල ප්‍රමාණයක් භාවිතා කරයි. තොරතුරු තාක්ෂණ අංශය මගින් "Hitachi Pentaho" කම්යුනිටි සර්වර් දෙපාර්තමේන්තුවේ සර්වර් පද්ධතිය තුල ස්ථාපිත කර ක්‍රියාත්මක කරන අතර, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවශ්‍යතා අනුව වාර්තා 20 කට වැඩි ප්‍රමාණයක් ලබාදෙයි. අපගේ දත්ත හුවමාරු ප්‍රතිපත්තියට අනුකූලව තොරතුරු තාක්‍ෂණ අංශය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය වැනි තෙවන පාර්ශ්වයන්ට බහුපරිශීලක පිවිසුම් සහ මුරපද ලබාදී ඇත.

5.11 දත්ත විශ්ලේෂණය සඳහා R භාෂාවේ භාවිතය වැඩි දියුණු කිරීම





**Figure 13:** R-Script සහ R –Shiny යන මෘදුකාංග නිර්මාණය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණය සඳහා තොරතුරු තාක්‍ෂණ අංශය මගින් R-Script සහ R–Shiny යන මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සිදු කරයි. තොරතුරු තාක්ෂණ අංශය විසින් ඒවා භාවිතා කරමින් සිතියම් හා වාර්තා 50කට වඩා නිර්මාණය කර ඇති අතර බහුතරයක් දත්ත IOTC වෙත වාර්තා කිරීමට භාවිතා කර ඇත.

# 6.0 මෙහෙයුම් අංශය

## 6.1 ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීමේ කටයුතු ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා කොළඹ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කරමින් ගොඩබිම හා ධීවර යාත්‍රා අතර සම්බන්ධතාවක් පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් ධීවර යාත්‍රා සඳහා කාලගුණ වාර්තා සහ හදිසි අයහපත් කාලගුණතත්ත්ව පිළිබද පූර්ව අනතුරු ඇගවීම් දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන් විසින් මුහුදේ ඇති තම යාත්‍රාව සමග සිදුකරනු ලබන අත්‍යවශ්‍ය පණිවුඩ හුවමාරු කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සපයනු ලබයි. ධීවර යාත්‍රාවලින් හදිසි පණිවුඩ ලැබුණු අවස්ථාවේ සිට සහන/මුදාගැනීම් කටයුතු සිදුකරන අවස්ථාව දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ කලාපීය සමුද්‍රීය බේරාගැනීමේ සම්බන්ධිකරණ මධ්‍යස්ථානය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යයන් සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලය සමග ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන 18 කටයුතු කරයි.

මැතකදී ආරම්භ කරන ලද මයිලිඩ්ඩි, දික්ඕවිට, වෙල්ලමන්කරය, කලමැටිය සහ කප්පරතොට යන ධීවර වරායන්වල ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජිතව ඇත. ධීවර දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගී කරගෙන දැනට සෝදිසි මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලබයි. ඉහත ධීවර වරායන් සඳහා නව ගුවන් විදුලි යන්ත්‍රවල අවශ්‍යතාවය දැඩි ලෙස පවතී.

## 6.2 ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.

අන්තර්ජාතික නීති රීතිවලට අනුකූලවීම සඳහා මහ මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවර යාත්‍රා සඳහා අන්තර්ජාතික ඇමතුම් සංඥා ලබාදීම ධීවර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව සිදුකරනු ලබයි. ධීවර යාත්‍රා හිමියන්ගේ අයදුම්පත් ලබාගෙන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එක්ව කටයුතුකරමින් ධීවර යාත්‍රාවල ගුවන් විදුලි පණිවිඩ හුවමාරුකිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම කඩිනම් කිරීම සඳහා සෝදිසි මෙහෙයුම් අංශය මැදිහත්වී කටයුතුකරනු ලබයි.

**වගුව 10: ඉල්ලුම්පත් ප්‍රමාණය**

| | |
|---|---|
| ලබා දෙන ලද ගුවන් විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍ර බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් ප්‍රමාණය | 618 |

**6.3. ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට අවශ්‍ය තොරතුරු සනාථ කර දීම.**

ධීවර යාත්‍රාවලට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඔවුන් විසින් රක්ෂණ වන්දි ලබාගැනීමේදී ද රක්ෂණ ආයතනවලට ධීවර යාත්‍රාවන් විසින් ලබාදෙන සියලු පණිවිඩ හුවමාරු තොරතුරු අදාළ ප්‍රාදේශීය කාර්යාලවලින් හා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා සටහන් ද භාවිතා කොට සහතික කර ඉදිරිපත් කරයි.

මෙම දෙපාර්තමේන්තුව සතුව ආපදාවට ලක්වන ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයන් බේරා ගැනීම , හදිසි ප්‍රතිකාර ලබා දීමට හා කඩිනමින් ගොඩබිමට රැගන ඒමට මුදාගැනීමේ යාත්‍රා නොමැති බැවින් නාවික හමුදාවේ සහ  වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනේ.

**වගුව 11: අනතුරු සංඛ්‍යාව**

| | |
|---|---|
| මහ මුහුදේදී වාර්තා වූ හදිසි අනතුරු සංඛ්‍යාව | 137 |
| මහ මුහුදේ  සිදු වූ පුද්ගල මරණ සහ අතුරුදහන් වීම් | 19 |
| හදිසි අනතුරු නිසා විනාශයට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව | 06 |

**6.4. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.**

**වගුව 12: විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම**

| රට | අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඉන්දියාව | 14 | 3 | 11 | 0 |
| මාලදිවයින | 13 | 3 | 1 | 0 |
| සීසෙල්ෂ් | 6 | 1 | 0 | 0 |
| මියන්මාර් | 5 | 1 | 5 | 0 |

මෙම නිදහස් කර ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යංශයේ කොන්සියුලර් අංශය මගින් ඉන්දියාව, මාලදිවයින, ප්‍රංශ මෙන්ම ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලවල සහය ලබා ගනු ලබයි.

**6.5 දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.**

**වගුව 13: මුදාගත් ධීවරයින්, යාත්රා සංඛ්‍යාව**

| මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව | අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|
| 460 | 84 | 6 |

එන්ජින් අක්‍රියවීම නිසා ආසන්න රටවල් වල මුහුදු සීමාවන්ට පාවී යන ලද, මුහුදේදී හදිසි අනතුරු වලට ලක් වන ලද ධීවර යාත්‍රා හා හදිසි අසනීප තත්ත්වයන්ට පත් වූ ධීවර කාර්මිකයින් ශ්‍රීලංකා නාවික හමුදාවේ/වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යාත්‍රා,වෙළඳ නැව් හා ධීවර යාත්‍රා මගින්ම බේරා ගැනීම් කටයුතු සිදු කරන ලද අතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා කඩිනමින් රෝහල් ගත කරන ලදි.

## 6.6 කුඩා / එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

වෙරළාසන්න ධීවර රැකියාවේ යෙදෙන කුඩා යාත්‍රා හා ධීවර පිරිස් වෙත හදිසි කාළගුණික වෙනස්වීම් පූර්ව කාළගුණික අනතුරු ඇඟවීම් ඉක්මණින් ධීවර ප්‍රජාව වෙත ලබා දී ජීවිත හානි වළක්වා ගැනීමේ අරමුණින් යුතුව ඩයලොග් ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා මෙම දෙපාර්තමේන්තුව ගිවිසුම් ගත විය. ඒ අනුව 2023වර්ෂයේ මේ වන විට ධීවර කාර්මිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් 100000ක් පමණ මෙම තොරතුරු සේවාවේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන් මෙහි ප්‍රතිලාභ භුක්ති විඳිමින් සිටි.

## 6.7. ධීවර ප්‍රජාව දැනුවත් කිරීම.

ධීවර ප්‍රජාව/ ධීවර කාර්මිකයින් හා යාත්‍රා අයිතිකරුවන් දැනුවත් කිරීම් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වුවද ධීවර කාර්මිකයින්ගේ ජීවිත ආරක්ෂාව සඳහා වන උපදෙස් හා හදිසි අනතුරකදී අනුගමනය කළ යුතු ආකාරය මෙන්ම ගොඩබිම සමග සම්බන්ධ වී හදිසි උපකාර සේවා ලබා ගන්නා ආකාරයද හදිසි කාලගුණ විපර්යාසයන්ට අනුව ඇතිවන සුළි කුණාටු වලදී ජීවිත ආරක්ෂා කිරීමට අනුගමනය කරන ක්‍රමවේදයන් හා ගුවන් විදුලි යන්ත්‍ර සඳහා බලපත් ලබා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් සිදුකිරීමට අත්‍යාවශ්‍ය බව පෙනීගියද මෙරට තුළ පවතින ආර්ථික අර්බුද තත්ත්වය මත නිසියාකාරව ඉටුකර ගැනීමට නොහැකි විය.

යාත්‍රාවල සේවයේ යෙදෙන්නන් මත් ද්‍රව්‍ය භාවිතාව ඉහළ යාම හා එමගින් ඇති වූ අහිතකර ප්‍රවණතාවක් ලෙස නැව් මාර්ගයේ අනතුරු සිදුවීම් ඉහළ ගොස් ඇති අතර ජීවිත හානි/ යාත්‍රා විනාශවීම් වැඩි වී ඇත. එමෙන්ම සංවිධානාත්මක අනවසර සංක්‍රමණ සඳහා යාත්‍රා යොදා ගැනීම බහුල වී ඇත. යාත්‍රා විශාල ප්‍රමාණයක් මහමුහුදේදී යාන්ත්‍රික දෝෂ සහිත වීම ඉහළ ගොස් ඇති අතර විශේෂයෙන්ම වෙනත් රටවල මුහුදු සීමා ආසන්නයේ සිදු වන ආපදා තත්ත්වයන් වැඩි වී ඇති බැවින් වෙනත් රටවල් සමගින් නිරන්තරයෙන් රාජතාන්ත්‍රික මැදිහත්වීම් මගින් ඒ ඒ රටවල බේරා ගැනීමේ මධ්‍යස්ථාන වෙත දන්වා යැවීමට සිදුවී ඇත. එබැවින් යාත්‍රා හිමියන් යාත්‍රා පිටත් කර යැවීමට ප්‍රථම නැවතත් තම යාත්‍රා නාවික ගමන් සඳහා යෝග්‍ය තත්ත්වයක පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා උනන්දු කරවීමට දැනුවත් කිරීම් කළ යුතුය.

**වගුව 14: එක් එක් වරායෙන් පිටත් වූ ධීවර යාත්‍රා සඳහා ලබා දුන් පිටත්වීම් ගණන-2023.01.01 - 2023.08.31**

| | වරාය | පිටත්වීම් ගණන |
|---|---|---|
| 1 | කල්පිටිය | 447 |
| 2 | මීගමුව | 4,343 |
| 3 | දික්ඕවිට | 1,031 |
| 4 | බේරුවල | 3,394 |
| 5 | අම්බලන්ගොඩ | 1,015 |
| 6 | හික්කඩුව | 822 |

| | වරාය | පිටත්වීම් ගණන |
|---|---|---|
| 13 | තංගල්ල | 1,217 |
| 14 | හම්බන්තොට | 474 |
| 15 | කිරින්ද | 425 |
| 16 | වාලච්චේන | 12,016 |
| 17 | ත්‍රිකුණාමලය | 2,337 |
| 18 | පොයින්ට්පේද්‍රුරු | 196 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | ගාල්ල | 3,900 | | 19 | මයිලිඩ්ඩි | 184 |
| 8 | මිරිස්ස | 2,641 | | 20 | වෙල්ලමන්කරය | 618 |
| 9 | දෙව්නුවර | 3,898 | | 21 | කප්පරතොට | 561 |
| 10 | කෝට්ටෙගොඩ | 1,281 | | 22 | ගන්දර | 1,113 |
| 11 | නිල්වැල්ල | 1,891 | | 23 | කලමැටිය | 220 |
| 12 | කුඩාවැල්ල | 3,716 | | | | |

**6.8** **වාර්තා සහ යාත්‍රා ණයාරූප දත්ත ගබඩාවට ඇතුළත් කීම හා කළමනාකරණය**

**වගුව 15: ලොග් වාර්තා සහ යාත්‍රා ණයාරූප දත්ත ගබඩාවට ඇතුළත් කිරිම හා කළමනාකරණය - 2023.01.01 -2023.08.31**

| | | |
|---|---|---|
| **1.** | මහ මුහුදේ මෙහෙයුම් වලට අදාළව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන | 1,834 |
| **2.** | මෙහෙයුම් වලට අදාළව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 1,834 |
| **3.** | ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන | 24,473 |
| **4** | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ණයාරූප දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද වාර්තා ගණන | 680 |

2015 වරාය රාජ්‍ය පියවරයයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් ලබාගැනීමට මසුන් ගොඩබෑමට හෝ ප්‍රතිනැව්ගත කිරීමට පැමිණෙන විදේශීය ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර නිකුත් තිරීම් හා යාත්‍රා පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 16/11 සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වරායවලට පිවිසෙන විදේශීය ධීවර යාත්‍රාවලින් අවමය 5%කට අදාළව සිදු කරනු ලබන පරීක්ෂණ වාර්තා ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

**වගුව 16: සේවාවන් වගුව 16: සේවාවන්**

| **සේවාවන්** | **නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව** | **පරීක්ෂාවන් සංඛ්‍යාව** |
|---|---|---|
| මසුන් ප්‍රති නැව් ගත කිරීම | 09 | 05 |
| නඩත්තු කටයුතු හා සැපයුම් සේවා | 04 | 01 |
| ආරක්ෂ නිලධාරීන් හා විදේශී ධීවර කාර්මිකයින් හුවමාරු කටයුතු සේවා | 08 | - |
| **එකතුව** | **21** | **06** |

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 11/04 සම්මුතියට අනුව මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා වලින් අවමය 5% ක් වන පරිදි විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂකයින් යොදවා තොරතුරු ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

2022 වර්ෂය තුළ දී මීටර 24 ට වඩා වැඩි දිගින් යුතු යාත්‍රා සඳහා යෙදවූ නිරීක්ෂකයින් සංඛ්‍යාවත්, එම යාත්‍රා සිදු කළ මෙහෙයුම් සංඛ්‍යාවත් පහත වගුවේ දක්වා ඇත.

වගුව 17: ධීවර යාත්‍රා

| මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව > 24m | 2022 ට සක්‍රිය යාත්‍රා සංඛ්‍යාව | මුළු ධීවර මෙහෙයුම් ගණන | විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 23 | 08 | 09 | 02 |

**6.9 ඉන්දියනු සාගර ටූනා කොමිසම ( IOTC ), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන හා සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.**

- ඉන්දියනු සාගර ටූනා කොමිසම සඳහා වාර්ෂිකව සැපයිය යුතු වාර්තා අදාළ දින වකවානුවලට යටත්ව සපයනු ලබයි.
- ඉන්දියානු සාගර ටූනා කොමිසමෙහි 10/11 සම්මුතියට අනුව සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවලට කමිටු රැස්වීම් සහ සැසිවාරවලට සහභාගීවීම සඳහා ලබාදෙන අරමුදල් යටතේ අදාල තාක්ෂණික නිලධාරීන් වාර්ෂික රැස්වීම සඳහා සහභාගී වූහ.
- ඒ අනුව ශ්‍රී ලංකාව 2010 වසරේ සිට පහත පරිදි අනුකූලතා ප්‍රගතිය පෙන්නුම් කර ඇත.

වගුව 18: අනුකූලතා ප්‍රගතිය

| 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5% | 18% | 47% | 51% | 60% | 74% | 77% | 82% | 87% | 90% | 86% | 76% | 83% |

ශ්‍රී ලංකාව ධීවර කර්මාන්තයෙහි ඉතා පොහොසත් රටක් වන අතර දැනට පවුල් 300,000ක් පමණ ධීවර කර්මාන්තයේ යෙදී සිටිති. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ එම සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ වගකීම දරයි. කළමනාකරණය සම්බන්ධයෙන්, අධීක්ෂණය අතිශයින් වැදගත් වන අතර DFAR හි ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයක් (FMC) නිර්මාණය කර වැඩිදියුණු කරනු ලබන්නේ ඉහත කාරණය සඳහා පමණි. FMC ප්‍රධාන වශයෙන් ඉලක්ක කරනු ලබන්නේ බහුදින යාත්‍රා 5200ක් සහ ඒවායේ ධීවර කටයුතු නිරීක්ෂණ කිරීමයි.

2015 වසරේ සිට යාත්‍රා 1500 මෙම VMS පද්ධතිය හරහා මහ මුහුදේ යාත්‍රා පාලනය සහ අධීක්ෂණය සිදු කෙරුණ ද, සෙසු යාත්‍රා (යාත්‍රා 4200ක් පමණ) VMS වලින් ආවරණය වී නොමැත. එබැවින් සියලුම බහුදින යාත්‍රා සඳහා VMS සවි කිරීම සඳහා සම්පූර්ණ බහුදින යාත්‍රාව අධීක්ෂණය කිරීමේ කාලෝචිත අවශ්‍යතාවයක් සහ මෙය කිරීමට හොඳම හා ලාභදායී ක්‍රමය විය. කෙසේ වෙතත්, ඔස්ට්‍රේලියානු රජය අවබෝධතා ගිවිසුමක් හරහා ඉහත VMS ඒකක 4200 මිලදී ගැනීම සඳහා අරමුදල් සමඟ සහයෝගීතාවය ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් ඔස්ට්‍රේලියානු රජය IOM (සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය) ස්වාධීන ආයතනයක් හරහා ජාත්‍යන්තර ලංසුවක් පවත්වා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගනු ලැබිණි. ඒ අනුව නව VMS පද්ධතියක්; (Blue Tracker VMS ) ශ්‍රී ලංකාවේ බහුදින ධීවර අංශයට හඳුන්වා දෙන ලදී. බ්ලූ ට්‍රැකර් ට්‍රාන්ස්පොන්ඩරය චන්ද්‍රිකා සේවාවක් ලෙස Iridium භාවිතා කරයි, එය අධීක්ෂණ කාර්යය සඳහා වඩාත්ම ලාභදායී සහ තාක්‍ෂණිකව පිළිගත හැකි ය. "දෙවන තිරය" ලෙස හැඳින්වෙන VMS පද්ධති මෘදුකාංගය අත්තිකාරම් වාර්තා සහ ඇඟවීම් පහසුකම වැනි බොහෝ අත්තිකාරම් විශේෂාංග හරහා අධීක්ෂණය කිරීමේ හැකියාව ඇත.

VMS පද්ධතිය හරහා ධීවරයින්ට ඵලදායි සේවා සැපයීමට හැකි වන පරිදි වෙබ් පාදක පද්ධතියක් හරහා වරාය නිලධාරියාට අධීක්ෂණ පහසුකම ලබා දිය හැක. ශ්‍රී ලංකාවේ යාත්‍රා බලඇණියේ ඇති බෝට්ටු වර්ග සඳහා ද මෙම උපකරණ සුදුසු ය. එබැවින් අනාගතයේදී VMS පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2020 අගෝස්තු අග දී VMS ස්ථාපනය ආරම්භ කළ අතර මේ වන විට ඒකක 4150 ක් පමණ ස්ථාපනය කර ඇත. VMS දිවයින වටා ඇති වරායන් 15 ක පමණ සවි කර ඇත. දෙවන තිර මෘදුකාංග වින්‍යාස කර ඇති අතර සියලුම භූ කලාප පරිගනක ගත කර ඇත. බෝට්ටු හිමිකරුවන්ගෙන් චන්ද්‍රිකා ගාස්තු අය කර ගන්නා ලද අතර ඒ අනුව DFAR මගින් සමාගමට මාසික බිල්පත් ගෙවනු ලැබේ. බිල්පත් ගෙවීම සහ උපකරණ නඩත්තු කිරීම ද ධීවර දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කරන ලද මෘදුකාංගයක් හරහා සිදු කෙරේ. නිලධාරීන්, බෝට්ටු හිමිකරුවන් සහ නායකයින් පද්ධතිය සහ එහි ක්‍රියාකාරී අංශ පිළිබඳව දැනුවත් ය. තවද බෝට් වීල් හවුස් තුළ ස්ටිකර් සවි කර ඇති අතර එමඟින් යානයේ වී.එම්.එස් ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික සහ නීතිමය අවශ්‍යතා පිළිබඳව නායකයින් දැනුවත් කෙරේ.

වත්මන් VMS බෝට්ටු හිමිකරුවන්ට ලාභදායී සහ කාර්යක්ෂම සේවා සැපයීමේ හැකියාව ඇත. මෙහිදී යාත්‍රාවේ සවි කර ඇති ඇන්ටනාව ඉතා අඩු බල අවශ්‍යතාවයකින් (2W) ක්‍රියා කරන අතර ප්‍රධාන බල සැපයුම නොමැති විට දින 3ක් දක්වා එහි උපස්ථ බලය භාවිතා කිරීමට හැකියාව ඇත. FMC කාර්ය මණ්ඩලයට පහසු සහ සුමට මෙහෙයුම් සිදු කිරීමට ඉඩ සලසන සම්ප්‍රේෂණ කටයුතු සිදු කිරීමේ හැකියාව ඇත. බෝට්ටුව අනෙකුත් රාජ්‍යයන්වල EEZ වැනි ප්‍රවේශය සීමා කරන ලද ප්‍රදේශ අසල ඇති විට ස්වයංක්‍රීය අනතුරු ඇඟවීම් නිර්මාණය කරයි.

EEZ තුළ ගමන් කිරීම සඳහා ඉනසන්ට් පැසේජ (innocent passages) භාවිතා කිරීමේදී වාර්තා කිරීමේ වාර ගණන පැය 04 සිට පැය 01 දක්වා වැඩි කර FMC කාර්ය මණ්ඩලයට යාත්‍රාව සමීපව නිරීක්ෂණය කිරීමට ඉඩ සලසයි. විකල්ප අවශ්‍යතා ලෙස සැපයුම්කරු විසින් යාත්‍රා තුළ සවි කිරීමට LED Conbox (සංදර්ශකය) ලබා දෙන අතර VMS පද්ධතිය සමඟ කටයුතු කරනු ඇත. ධීවර දෙපාර්තමේන්තුවට සහ යාත්‍රා හිමිකරුට මාළු සොයා ගැනීම, අනතුරු ඇඟවීම්, දේශගුණය පිළිබඳ දේශීය භාෂාව සමඟ සන්නිවේදනය කිරීමට ඉඩ සලසයි. යාත්‍රාවේ හිමිකරුවන්ට සුහුරු (ස්මාර්ට්) ජංගම දුරකථනය හරහා තනි තනිව තම යාත්‍රා නිරීක්ෂණය කළ හැකි වන පරිදි විකල්ප සේවාවක් ලෙස බෝට්ටු හිමිකරුට ජංගම අතුරු මුහුණත ලබා දීමට පද්ධතියට හැකියාව ඇත.

ශ්‍රී ලංකාව  බහුවිධ අර්බුදයකට මුහුණ දී සිටියද, පළමු කොවිඩ් 19 වසංගතය සහ වර්තමානයේ ආර්ථික අර්බුදයක් ඇති වුවද, එහි පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ (IUU) මසුන් ඇල්ලීම අවම කිරීම සහ මුහුදේ ධීවර ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා එහි අධීක්ෂණ හැකියාවන් යටතේ තවත් යාත්‍රා 2000 ක් එක් කිරීමට DFAR සැලසුම් කරයි.

VMS පද්ධතියට අදාළ සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ විය හැකි අතර DFAR හි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් මධ්‍යගතව කළමනාකරණය කරයි. දැනට FMC යාත්‍රා 24x7 නිරීක්ෂණය කරයි. විදේශ රටවලට ඇතුළු වීම, VMS හානි  කිරීම වැනි සැක කටයුතු හැසිරීම් හඳුනා ගැනීම FMC හි ප්‍රධාන රාජකාරිවලින් එකකි. FMC දිනපතා සංඥා නොමැති හෝ අඩු සංඥා සහිත යාත්‍රා (නිහඬ යාත්‍රා ලෙස හැඳින්වේ.) හඳුනාගෙන ඔවුන්ගේ යාත්‍රාව නැවත අදාල ක්‍රමවේදයට ඇතුලත් වන තුරු යාත්‍රා පිටත්වීම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

දීර්ඝ කාලසීමාවක් සහිත VMS අක්‍රීය යාත්‍රා ඇතුළු සියලු සැක කටයුතු යාත්‍රා පිළිබඳ තොරතුරු පරීක්ෂණ පැවැත්වීම සඳහා විමර්ශන අංශය වෙත යොමු කරනු ලැබේ. මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දේශසීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි අවදානම් යාත්‍රා හඳුනාගැනීම

සඳහා ආදර්ශයක් සකස් කිරීම සඳහා අඛණ්ඩ සමීක්ෂණ පවත්වන ලදී. නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ හැකි යාත්‍රා හඳුනා ගැනීම සඳහා රටා හඳුනාගැනීම් හඳුන්වා දීමට FMC අපේක්ෂා කරයි. ඕස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා VMS ව්‍යාපෘතිය යටතේ FMC සියලු නවීන තාක්ෂණයෙන් ද නවීකරණය කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා FMC ආසියාවේ අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.



**Figure 14:** යාත්‍රා අධීක්ෂණ මධ්‍යස්ථානය
























**Figure 15:** විශේෂ අවස්ථා

# 03
# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
# (NAQDA)

## දැක්ම

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසර සංවර්ධනය සහ කළමනාකාරීත්වය තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම

## මෙහෙවර

කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යවසායන් සංවර්ධනය දිරිමත් කිරීම හා චිරස්ථායී ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුලින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමත් ග්‍රාමීය සමාජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.

## කාර්යභාරය

- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් සංවර්ධනය තුළින් මත්ස්‍ය නිෂ්පාදනය සහ මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම.
- මිරිදිය සහ කිවුල්දිය ජලජීවී වගාව සංවර්ධන කිරීම තුළින් ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සුලභ කිරීම.
- අපනයනය සඳහා වැඩි වටිනාකමක් ඇති ආහාරමය මත්ස්‍ය වගාව, විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි වගාව දියුණු කිරීම.
- පරිසර හිතකාමී ක්‍රමවෙදයන් අනුගමනය කරමින් ජලජීවී සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
- කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණයේ ජලජීවී ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.
- ජෛව විවිධත්ව ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව, ජලජ සම්පත් හා වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ජලජ සම්පත් ආනයනය, අපනයනය, විකිණීම සහ බෙදාහැරීම පිළිබඳ ව්‍යාපාරිකයෙකු, පහසුකම් සපයන්නෙකු සහ බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම සහ ඒ කටයුතු වලට සහාය වීම.
- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම හා ආහාර සුරක්ෂිතතාව, ජනතාවගේ පෝෂණය, රැකියා/ජීවනෝපාය අවස්ථා සැපයීම සහ විදේශ විනිමය ඉපැයීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර. රටෙහි සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් 29%ක පමණ දායකත්වයක් මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය මගින් සපයයි.

| ඉලක්කය 2023 (මෙ.ටොන්) | මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටොන්) (ජනවාරි - සැප්තැම්බර්) | ඉලක්ක සපුරාලීම |
|---|---|---|
| 158,000 | 82,055* (මුහුදු පැළැටි නිෂ්පාදනය ද ඇතුලත් වේ.) | 52% |


*යාවත්කාලීන විය හැක.



2023 වසරේ සැප්තැම්බර් මස වන විට නිත්‍ය හා කාලීන ජලාශ වල වගා පාදක ධීවර කර්මාන්තයෙන් හා මිරිදිය ජලජීවී වගාව තුලින් මෙ.ටොන් 70,785ක මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගෙන ඇත. එමෙන්ම කිවුල්දිය ඉස්සන් ඇතුළුව වෙරළබඩ ජලජීවී වගාව තුලින් මෙ.ටොන් 11,270ක මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගෙන ඇත.

## මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් ජලාශ වල තැන්පත් කිරීම

අගෝස්තු මස දක්වා මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටන් තැන්පත් කිරීමේ ඉලක්ක සහ ප්‍රගතිය රූපසටහන් 1 මඟින් පෙන්වා ඇත.




රූපසටහන් 1: මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීමේ ඉලක්ක සහ ප්‍රගතිය






2023 වසරේදී මත්ස්‍ය ඇඟිල්ලන් සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම සිදු කරනු ලබන්නේ ධීවර සමිති සහ අනෙකුත් ආයතනවල අරමුදල් පමණක් භාවිතා කරමිනි. නොමිලේ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ වැඩසටහන සඳහා රජයේ මුදල් නොමැතිකම හේතුවෙන් මත්ස්‍ය ඇඟිල්ලන් සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම අඩු වී ඇත.

## මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය


මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලාශවල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයක් වේ. උඩවලව, දඹුල්ල, ඉඟිනියාගල, ඉරණමඩු, කලාවැව, නුවරඑළිය, පොළොන්නරුව සහ මුරුතවෙල යන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල නිෂ්පාදනය කරන මත්ස්‍ය ඇසිත්තන්, මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමට පෞද්ගලික පොකුණු, කොටු, කූඩු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක **සඳහා** ලබා දේ. එමෙන්ම පම්බල, කහඳමෝදර හා කල්ලරාව මධ්‍යස්ථානවල මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය කරයි. අගෝස්තු මාසය දක්වා වන මත්ස්‍ය බීජ නිෂ්පාදනය රූපසටහන 2 හා රූපසටහන 3හි දක්වා ඇත.








රූපසටහන 2: ජලජීවී මධ්‍යස්ථානවල මත්ස්‍ය බීජ නිෂ්පාදනය




රූපසටහන 2: පෞද්ගලික පොකුණු , කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, කුඩු, කොටුවල මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

## තඹලයා (*Labeo lankae*) අභිජනනය හා නැවත හඳුන්වාදීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ පමණක් දැකිය හැකි තඹලයා /තඹලවැන්නා (*Labeo lankae*) මධ්‍යම ප්‍රමාණයේ මිරිදිය මත්ස්‍යයෙකු වන අතර උතුරු මැද හා වයඹ විශාල කලාපයේ දැකගත හැකි සුවිශේෂී මත්ස්‍යයෙකි. මල්වතු ඔය, කලාඔය සහ පරංගිආරු යන ගංගා ද්‍රෝණීන් ඔවුන්ගේ නිජබිම වේ.



මෙම මත්ස්‍ය විශේෂය පසුගිය වසර 40 තුළ නිජබිම් ආශ්‍රිත පරිසරයෙන් තුරන් වූ බවට වාර්තා වුවත් 2018 දී මල්වතු ඔය ද්‍රෝණියේ මැද හා පහළ ප්‍රදේශයෙන් නැවත සොයා ගන්නා ලදි. විවිධ මානව ක්‍රියාකාරම් වන අනවසර ධීවර පන්න භාවිතය, පරිසරයේ ඇති කරන ලද විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සහ විලෝපික මසුන්ගේ තර්ජනය නිසා ඇති වූ පීඩාකාරී තත්ත්ව හේතුවෙන් දැනට ඉතිරිව ඇති මත්ස්‍ය ගහණය දැඩි පීඩාකාරී තත්ත්වයකට මුහුණපා ඇත.

වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති තඹලයා, දඹුල්ල මත්ස්‍ය ජාන ඒකකයේ දී විවිධ විද්‍යාත්මක ක්‍රම පදනම් කර ගනිමින් පරීක්ෂණ සිදුකර එහි ප්‍රතිඵලයක් ලෙස අවුරුදු 2කකට පසු ප්‍රේරිත අභිජනන ක්‍රමවේදය මගින් අභිජනනය සාර්ථක කර ගැනීමට හැකි විය. ලෝක ජෛව විවිධත්ව දිනයට සමගාමීව 2023.05.22 දින ඉහළ මල්වතුඔය ද්‍රෝණියේ පිහිටි හබරණ තුම්බිකුලම් වැවට තඹලයා මසුන් 32,000ක් තැන්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂ සංරක්ෂණය කිරීම සඳහා සංවිධානය කරන ලද පළමු වැඩසටහන ලෙස මෙය ඉතිහාසගත විය. මෙම ස්වාභාවික පරිසරයෙන් තුරන් වීමේ අවධානමට ලක් වූ මත්ස්‍යයන් ඔවුන්ගේ නිජභූමියට නැවත හඳුන්වාදීමේ වැඩසටහන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් විශ්වවිද්‍යාල සහ මේ හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු ධීවර විශේෂඥ කණ්ඩායම්වල සහාය ඇතිව සිදුකරන ලදි.

## වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

### කිවුල්දිය ඉස්සන් වගාව

මෙය ශ්‍රී ලංකාවේ විශාලතම වාණිජ ජලජීවී වගා ක්‍රියාකාරකම වේ. අධිකාරියෙහි අඛණ්ඩ නිරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු හේතුවෙන් වර්ථමානය වනවිට ඉස්සන් කර්මාන්තය ඵලදායී මට්ටමකට පැමිණ ඇත. ඉස්සන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රමයක් හඳුන්වාදීම සහ වගා කරන ප්‍රදේශවල ජෛව සුරක්ෂිතතාව ඉහළ නැංවීම තුළින් ඉස්සන් වගා ක්‍රියාකාරකම් තීව්‍ර කිරීම මෙන්ම ඕලන්ද ඇළ හැරීම, පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් ගොවිපළ සඳහා පොදු විදුලි සැපයුමක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් 8545ක අස්වැන්නක් ලබා ගෙන ඇත.





### මුහුදු කූඩැල්ලන් අභිජනනය හා වගාව



මුහුදු කූඩැල්ලන් වාණිජමය වශයෙන් ලබා ගත හැකි ඉහළම වටිනාකමින් යුත් මුහුදු මත්ස්‍ය විශේෂයක් වේ. අපනයන වෙළෙඳපොළ තුළ මුහුදු කූඩැල්ලන් සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් දේශීය ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සඳහා සහ රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒම සඳහා මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. පුද්ගලික අභිජනනාගාරවල මුහුදු කූඩැල්ලන් අභිජනනය කිරීම සඳහා අධිකාරිය විසින් තාක්ෂණික දැනුම ලබා දෙමින් මේ වන විට යාපනයේ එක් පුද්ගලික අභිජනනාගාරයක් ක්‍රියාත්මක වේ. පෞද්ගලික අංශය විසින් මන්නාරම, කිළිනොච්චිය, යාපනය සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල මුහුදු කූඩැල්ලන් වගාව ක්‍රියාත්මක අතර 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් 407 (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත. මුහුදු කූඩැල්ලන් අපනයනය ඉහළ නැංවීම සඳහා මුහුදු කූඩැල්ලන් ගම්මානය කිලිනොච්චියේ වලෙයිපාඩු ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. එමෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ මුහුදු කූඩැල්ලන් වගාව සඳහා අක්කර 1900ක් හඳුනාගෙන ඇත.

### මොදා මත්ස්‍ය වගාව

ගම්පහ, මඩකළපුව, මන්නාරම, ගාල්ල, හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. තව ද මහා පරිමාණ කූඩු තුල මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ පවත්වා ගෙන යන අතර මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුහුදු මත්ස්‍ය ගොවිපළ වේ. 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් 942ක අස්වැන්නක් ලබා ගෙන ඇත.





### මුහුදු පැළැටි වගාව

උතුරු හා වයඹ පළාත් මුහුදේ මුහුදු පැළැටි වගාව ප්‍රජා සහභාගීත්වයෙන් සිදු කිරීමට අධිකාරිය විසින් පියවර ගෙන ඇත. 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් 1239 (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත.





## විසිතුරු මත්ස්‍ය වගාව



නැක්ඩා ආයතනය (NAQDA) විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරිම, තාක්ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණයන, පුහුණුව සහ තාක්ෂණ උපදෙස් සැපයීම යනාදිය මඟින් විසිතුරු මසුන් හා ජලජ පැලෑටි වගාව මෙන්ම අපනයන සඳහා සහාය වෙනු ලබයි.

රම්බඩගල්ල, ගිනිගත්හේන සහ සෙවණපිටිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැළෑටි වගාව සංවර්ධනයට අදාල කාර්යයන් සඳහා වෙන්කර ඇත. මෙම මධ්‍යස්ථාන මඟින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට විසිතුරු මසුන් මිලියන 2.70ක් ගොවීන්ට හා අපනයනකරුවන්ට අළෙවිකර ඇත. තව ද රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යසථානය මඟින් පුද්ගලයන් 595 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී.

මිරිදිය විසිතුරු මසුන් වඩාත් වර්ණවත් හා කැපී පෙනෙන ගප්පි, ස්වෝඩ්ටේල්, ප්ලේටි, බාර්බ්ස්, ටෙට්‍රා, ඒන්ජල්, ගුරමි සහ කැට්ෆිෂ් විශේෂ වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද මෙම මිරිදිය විශේෂ අතුරින් 50-60% පමණ ගප්පින්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ නිත්‍ය අපනයන සමාගම් 45 ක් පමණ ඇත. ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් සඳහා ප්‍රධාන ගැනුම්කරුවන් වන්නේ ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය, ඕස්ට්‍රේලියාව, පෝලන්තය, ප්‍රංශය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉතාලිය යන රටවල් ය.

මිරිදිය විසිතුරු මසුන් හා සසඳන විට කරදිය විසිතුරු මත්ස්‍යයන්ට ඉතා ඉහළ මිලක් හිමිවන අතර ජාත්‍යන්තර වෙළෙඳපොළේ ද ඉහළ ඉල්ලුමක් පවතී. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන පරාසය වැඩිකිරීම, කරදිය විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් අපනයන ආදායම වැඩිකිරීම, තාක්ෂණික දැනුම ලබා දීමේ අරමුණු ඇතිව පුත්තලම බංගදෙණියෙහි කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමට කටයුතු කර ඇති අතර මෙම මධ්‍යස්ථානය රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යවසායකත්වයක් යටතේ ක්‍රියාත්මක වේ.



## ජලජීවී නිෂ්පාදන අපනයනය

| මත්ස්‍ය විශේෂය | 2023 (ජනවාරි - සැප්තැම්බර්) | |
|---|---|---|
| | අපනයන ප්‍රමාණය(මෙ.ටොන්) | අපනයන වටිනාකම (රු.මි) |
| ඉස්සන් | 2942.6 | 7,349.0 |
| විසිතුරු මසුන් | n.a | 6,373.7 |
| මුහුදු කූඩැල්ලන් | 308.2 | 3,592.6 |
| කකුළුවන් | 1,171.8 | 5,320.6 |

# 04
# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA)

**දැක්ම**

කලාපයේ ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රමුඛතම ආයතනය වීම.

**මෙහෙවර**

විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම සහ සම්පත් පදනම උපයෝගී කරගනිමින් ජලජ සම්පත් අංශයේ ජාතික සංවර්ධන ගැටලු සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

**කාර්යභාරය**

- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) යනු ජලජ සම්පත් ආශ්‍රිත පර්යේෂණ, සංවර්ධන සහ කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන ජාතික ආයතනයයි.
- ජීවී හා අජීවී ජලජ සම්පත් සම්බන්ධ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික විශේෂඥතාව යොදා ගැනීම සහතික කිරීම.
- පහත සඳහන් ක්ෂේත්‍රවල ජලජ සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා යොමු වූ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ ප්‍රවර්ධනය කිරීම;
    - ➢ සාගර විද්‍යාව සහ ජල විද්‍යාව.
    - ➢ ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න සහ උපකරණ සහ ධීවර ක්‍රම වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.
    - ➢ ධීවරයින්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුභසාධනය ඇතුළුව ධීවර කර්මාන්තයේ සමාජ හා ආර්ථික අංශ.
    - ➢ මත්ස්‍ය හා ජලජ නිෂ්පාදන සැකසීම, සංරක්ෂණය සහ අලෙවි කිරීම.
    - ➢ අභ්‍යන්තර ජලාශ, වෙරළබඩ තෙත් බිම් සහ වෙරළාසන්න ප්‍රදේශවල ජලජ සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය.
    - ➢ ජලජ සම්පත් සූරාකෑම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සම්බන්ධ විද්‍යාත්මක, තාක්ෂණික සහ නීතිමය කාරණා සම්බන්ධයෙන් උපදේශන සහ උපදේශන සේවා සැපයීම.
- ජලජ සම්පත් සූරාකෑම වැලැක්වීම, සැලසුම් කිරීම, පර්යේෂණ, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය සහ කළමනාකරණය සම්බන්ධව ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සහ ධීවර කර්මාන්තය සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු සහ දත්ත රැස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රකාශනය කිරීම භාර ගැනීම.
- නියෝජිතායතනයේ කටයුතු කරගෙන යාමට හෝ සහාය වීමට අවශ්‍ය පුද්ගලයින් සඳහා පුහුණුව ලබා දීම..

## 1. ව්‍යාපෘති සාරාංශය

## 1. අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය

**ව්‍යාපෘතිය 1 : සූක්ෂම වගාවේ පාලිත තත්ත්වය (*in vitro*) යටතේ සිදු කරන ප්‍රචාරණය සඳහා තාක්ෂණික ක්‍රම සංවර්ධනය මගින් අපනයනය කේන්ද්‍ර කර ගත් විසිතුරු ජල ජීවී කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.**

**සංරචකය 1: තෝරා ගත් විවිධ වර්ගයේ විසිතුරු ගප්පි සඳහා සූක්ෂම වගා තාක්ෂණය සංවර්ධනය කිරීම .**

ඒකක ක්ෂේත්‍ර ඵලයක් තුළ තැන්පත් කල හැකි ගප්පි මසුන් (Poecilia reticulate) ප්‍රමාණය වැඩි කිරීමෙන් ප්‍රතසංසරණ ජල ජීවී වගා පද්ධතිය (Re-circulating Aquaculture System-RAS) සංවර්ධනය කිරීම .




රූපය 1: නවීකරණය කල පසු ප්‍රති-සංසරණ ජලජීවී වගා පද්ධතිය

**සංරචකය 2 : ආවේනික *Dawkinsia විශේෂය හා පෙතියා විශේෂය දෙමුහුම් කර* විවිධ විසිතුරු මසුන් ප්‍රභේද බෝකිරිම**

- පිරිමි *Dawkinsia filamentosus* සහ ගැහුනු *D. srilankensis* මව් මසුන් විවෘත පොකුණු තුළ දෙමුහුම් (cross-breeding) කිරිමේ පර්යේෂණය. ඔවුන්ගේ ජනිතයන් ඇගයිම සඳහා ඔවුන්ගේ ආකර්ෂණිය ලක්ෂණ වන පහසුවෙන් හඳුනාගත හැකි බ්ලැක් හෙඩඩ් ලක්ෂණය අධ්‍යනය කිරිම. (රූපය**2**) ලිංගිකව පරිණත වූ පසු බ්ලැක් හෙඩඩ් ජනිතයන් නැවත දෙමුහුම් කිරිම.

- තවත් දෙමුහුම් (cross-breeding) අත්හදා බැලීමක් එකම මව් මසුන්ගේ ජනිතයන් භාවිතා කරමින් අගෝස්තු මාසයේදී 5’X5’සිමෙන්ති ටැංකිවල සිදු කිරිම.



(රූපය**2**) බ්ලැක් හෙඩඩ් දෙමුහුම –F1 පරම්පරාව

**සංරචකය 3 : තෝරාගත් *Bucephalandra* විශේෂය පාලිත තත්ත්වය (*in vitro*) යටතේ ප්‍රචාරණය කිරීමට කෙටුම්පතක් සංවර්ධනය කිරීම සහ ජලජ පැළෑටිවල ප්‍රචාරණය හෝ ඒවා ජලජ පාෂාණවලට හුරු කිරීම සංවර්ධනය කිරීම.**

*Bucephalandra විශේෂය* පාලිත තත්ත්වය යටතේ ප්‍රචාරණය සඳහා කෙටුම්පතක් සංවර්ධනය කිරීම ජලජ පැළෑටි හුරු කිරීම හෝ ප්‍රචාරණය කිරීම සඳහා අදාළ ජලජ පාෂාණ වර්ග තුනක් සංවර්ධනය කිරීම (රූපය3A). *Nympheae midnight* විශේෂයේ කැලස් (*Callus*) සංවර්ධනය සඳහා පර්යේෂණයක් සිදු කිරීම.

කලුතර දිස්ත්‍රික්කය තුළ දැනුම ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් සහ විසිතුරු පැළ හා මසුන්ගේ දාම වෙළඳපොළ සංවර්ධනය කිරීමට වැඩසටහන් දියත් කිරීම. අලෙවිය සඳහා පටක රෝපණය මගින් *Crytocoryne wendtii* පැලෑටිය පිළියෙල කිරීම (රූපය3B).







රූපය 3A :විවිධ ජලජ පාෂාණ වර්ග

රූපය 3B : පටක රෝපණය මගින් නිෂ්පාදිත *Crytocoryne wendtii* පැලෑටිය

**ව්‍යාපෘතිය 2 : ශ්‍රී ලංකාවේ උතුරු පළාත තුළ මුහුදු කූඩැල්ලන් (*Holothuria scabra*) වගාව වර්ධනය සඳහා ප්‍රශස්ථ වගා තත්ත්වයක් ඇගයීම.**

ඉස්මතු වී පෙනෙන විවේචනාත්මක ගැටලු 5ක් හඳුනා ගෙන ඉලක්ක කරගත් වගාකරුවන් කාලෝචිතව ගලපමින් සහ සක්‍රීයව මැදිහත් කර ගනිමින් ක්ෂේත්‍ර වැඩසටහන් 3ක් අඛන්ඩව සිදු කිරීමෙන් වාණිජ වගාවල තිරසාරත්වය සංවර්ධනය කිරීම (රූපය 4). මුහුදු කූඩැල්ලන් වගා කිරිමේ උපාය මාර්ගයන්ට බලපාන විශේෂිත පුළුල් පාරිසරික බලපෑම අවධාරණය කරගැනීමට ඔවුන් වගා කරන කූඩු ආශ්‍රිතව මුහුදේ පර්යන්ත ප්‍රදේශයේ විද්‍යාත්මක අධ්‍යානයක් අඛන්ඩව කරගෙන යනු ලැබීම. ආහාර ලබා දීමේ පර්යේෂණ පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ජලජ තත්ත්ව අධීක්ෂණය කිරීමෙන් සකසන ලද ආහාර වල සුදුසු භාවය හා ජීව්‍යතාවය අනාවරණය කර ගැනීම.

ප්‍රජා සහභාගීත්ව හා දැනුවත් කිරිමේ සහ ප්‍රජා මූල වැඩසටහන් හරහා පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් මුහුදු කූඩැල්ලන් වගා කටයුතු ප්‍රවර්ධනය කිරීම. පාර්ශ්වකරුවන් 20 ක් මෙම වැඩසටහන් වලට සහභාගී වීමෙන් ජලජීවී වගාවේ තිරසර ප්‍රවර්ධනයට ඔවුන්ගේ ඇති විභවතා, උනන්දුව හා කැමත්ත පිළිබිඹු කරයි.




රූපය 4: අධ්‍යනය අතරතුර සිදුකරන ක්ෂේත්‍ර කටයුතු

## 2. සමුද්‍ර ජීව විද්‍යා අංශය

**ව්‍යාපෘතිය 1: විශාල සාමුද්‍රික ධීවර සම්පත් අධීක්ෂණය සහ තක්සේරු කිරීම.**

ශ්‍රී ලංකාවේ මරුවල් පන්නය ආශ්‍රිතව සිදු කරන ලද අධ්‍යනයකට අනුව සප්පරු මත්ස්‍යයන් අල්ලා ගැනීමේ ශීඝ්‍රතාවය "ඇම්" සඳහා යොදාගන්නා මත්ස්‍ය විශේෂය අනුව වෙනස් වේ. මෙහිදී සප්පරු මසුන් ඇල්ලීමේ ඉහල විභවයක් ඇත්තේ "ලින්නා" මසුන් "ඇම" ලෙස යොදා ගැනීම වන අතර මෙය "කඩු කොප්පරා" මත්ස්‍ය විශේෂයටද වැදගත් වේ. ශ්‍රී ලංකාවේ "ඇටවල්ලන්" විශේෂය ගහණ ගතිකත්වය පිළිබඳව කරන ලද පර්යේෂණයට අනුව මෙම මසුන් අධිකව ඇල්ලීමේ වර්ධනයක් පෙන්නුම් කිරීමේ හැකියාවක් පවතී. (රූපය 5)




රූපය 5: විවිධ ඇම වර්ග වලට අනුව කඩු කොප්පරා අල්ලා ගැනීමේ සීඝ්‍රතාවන්


- වටකරන දැල්වලින් අල්ලන ලද මෝරුන් විශේෂ අතරින් බහුතරය හොඳ මෝරාගෙන් සමන්විත වන අතර ඉන් 80% ට වඩා වැඩි ප්‍රමාණයක් වයස අඩු මත්ස්‍ය පැටවුන් විය. එම නිසා මෙම මත්ස්‍ය ගහණ ගණත්වය අවම වීම වලක්වාලීම සඳහා කළමනාකරණ පියවර ගත යුතුය.

**ව්‍යාපෘතිය 1: කුඩා සාමුද්‍රික මත්ස්‍ය ඇස්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයෙ ඇති කුඩා සමුද්‍රික මත්ස්‍ය සම්පත ඒකක ප්‍රයත්නයකට අල්ලා ගැනීමේ අගයන් හා මධ්‍යනය පෝෂී මට්ටම අගයනවල අඩුවීමක් පෙන්නුම් කල අතර ඇල්ලීමට ඉලක්ක නොවන මත්ස්‍ය විශේෂවල වැඩිවීමක් පසුගිය දශක දෙක තුලදී දක්නට ලැබිණි. මේ සඳහා අධික ලෙස ඉලක්කගත මසුන් ඇල්ලීමත්, කාලගුණික විපර්යාසයන් හේතු වී ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ කුඩා සාමුද්‍රික ධීවර කර්මාන්තය තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**මුහුදු කුඩැල්ලන් සමීක්ෂණය :** මුලතිව් ප්‍රදේශයේ වෙරළබඩ කලාපයේ ලයින් නූල් අට්ටයන් ආශ්‍රිතව දිය යට කරන ලද සමීක්ෂණයට අනුව අනාවරණය වූයේ *Bohadschia vitensis* (නූල් අට්ටයා) විශේෂය බහුලව පවතින විශේෂය වන අතර වසරකට ටොන් 418.5 ක උපරිම අස්වැන්නක් ලබාගත හැකි බවයි. *Holothuria edulis* විශේෂය අවම වශයෙන් වාර්තාවන අට්ටයන් වන අතර ඔවුන්ගේ ප්‍රමාණය ටොන් 10 ට වඩා අඩු අගයක පවතී. එම නිසා මත්ස්‍ය අස්වැන්න ලබාගැනීම සඳහා නිර්දේශ නොකරයි. තවද, *Holothuria spinifera* බිස්කෝ අට්ටයා සහ *Stichopus naso* පාවක්කා නම් විශේෂ 02 වසරකට පිළිවෙළින් ටොන් 16.65 ක් සහ ටොන් 18.75 ක උපරිම සීමාවක් සහිතව අස්වනු නෙළීමට නිර්දේශ කෙරේ.

**ජෛව අණුක විද්‍යා කාර්යයන් : 2023** පෙබරවාරි 11 වන දින කල්පිටිය කන්දකුලිය වෙරළ තීරයේ නියමු තල්මසුන් 14 දෙනෙකු වෙරළට ගොඩගසා තිබුණි. ඔවුන් බේරාගැනීම සඳහා විශාල පරිශ්‍රමයක් දරනු ලැබූ අතර ඉන් තුන් දෙනෙකු මියගිය අතර තවත් එක තල්මසෙකුද පසුව මියයන ලදී. මෙම මියගිය තල්මසුන් තුන් දෙනෙකුගෙන් සාම්පල ලබාගෙන අනුක අධ්‍යනය සිදුකරන ලදී. මෙසේ ලබාගත් අනුක දත්තයන් NCBI යන දත්ත සමුදාය සමග ගලපන ලදී. එය 98% කට වඩා වැඩි නිරවද්‍යතාවයකින් යුක්ත *Globicephala macrorhynchus* විශේෂය ලෙස හඳුනා ගන්නා ලදී. සාමාන්‍ය ව්‍යවහාරයේ දී මොවුන් කෙටිවරල් නියමු තල්මසුන් (short fined pilot whales) ලෙස හැඳින්වේ.




රූපය 6: 2023 පෙබරවාරි 11වන දින කල්පිටිය වෙරළට පැමිණි තල්මසුන් ගලවා ගැනීමේ මෙහෙයුම


## 3. ජාතික සාගර විද්‍යා සහ සාමුද්‍ර විද්‍යා ආයතනය

**ව්‍යාපෘතිය 1: ටූනා ධීවර බිම් පුරෝකථනය පිළිබඳ උපදේශන සහ ධීවර තොරතුරු සේවා ව්‍යාපෘතිය**

NARA විසින් Yellow fin tuna සහ skipjack tuna (බලයා) පිළිබඳ වෙනම ධීවර බිම් උපදේශන දෙකක් සතියකට දින තුනක් නිකුත් කරයි (රූපය 8). බහුදින ධීවර කණ්ඩායම් (යාත්‍රා හිමිකරුවන් සහ නායකයින්) සහ DFAR නිලධාරීන්ට WhatsApp කණ්ඩායම් සාමාජිකයින් (>අංක 700) ඊමේල් (යාත්‍රා හිමිකරුවන් ඇතුළුව ග්‍රාහකයින් 380) ; FIS NARA[https://www.facebook.com/tuna.forecast](https://www.facebook.com/tuna.forecast)) Facebook පිටුව (අනුගාමිකයින් 1700 ක්/ පෝස්ට් 2000+ ) හරහා උපදේශන බෙදා හරිනු ලැබේ.

Dialog "සයුරු" ජාල ව්‍යාපෘතිය හරහා වරාය 5ක රූපවාහිනී තිර මගින් ධීවර බිම් පුරෝකථන පිළිබඳ උපදේශන ප්‍රදර්ශනය කිරීම හා Facebook අනුගාමිකයින් 25000 දැනුවත් කිරීමේ වැඩසටහන්


පැවැත්වීය. ඊට අමතරව සියලුම සක්‍රීය ධීවර වරායන්හි සිංහල හා දෙමළ භාෂා බැනර් ප්‍රදර්ශනය කිරීම සහ පත්‍රිකා බෙදා හැරීම සිදු වේ.




**රූපය 8.**2023-09-06 නිකුත් කරන ලද Yellow fin tuna (කහවරල් කෙලවල්ලා) බිම් පුරෝකතනය

**ව්‍යාපෘතිය 2 : විදේශ විනිමය වැඩි දියුණු කිරීමේ මෙවලමක් ලෙස ශ්‍රී ලංකාවේ ගිනිකොනදිග වෙරළ තීරයේ වැලි නිධි පූර්වේක්ෂණය කිරීම සහ ප්‍රමාණය කිරීම.**


අපනයන වෙළෙඳපොළ ශක්තිමත් කරමින් අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා ගාර්නට් (garnet) වැලි නිධි හඳුනා ගැනීම ව්‍යාපෘතියේ අරමුණයි. මේ සඳහා හම්බන්තොට සහ උස්සන්ගොඩ ප්‍රදේශවලින් වෙරළ වැලි සාම්පල ලබාගෙන ඇත. මෙහි 1-45 mm ප්‍රමාණයේ වැලි සමීක්ෂණය කරන ලද ප්‍රදේශවල 50-80% අතර පවතී. (රූපය 9)




රූපය 9. හම්බන්තොට ප්‍රදේශයේ සාන්ද්‍රිත ඛනිජ වැලි (L) ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කර (R).

**ව්‍යාපෘතිය 3: පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශය යටතේ කළපු ගතිකත්වය සහ පරිසර විද්‍යාව ප්‍රතිස්ථාපනය කිරීම: ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ ලංකාපටුන කළපුව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්.**

පළමු අන්තර් මෝසම් කාලය තුළ කළපුවේ ලවණතා පරාසය 2022ට වඩා සාපේක්ෂව අඩු වී ඇත. (රූපය 10 සහ 11). මෙයට හේතුව වන්නේ පසුගිය වසරට වඩා වැඩි ජල ප්‍රමාණයක් ගඟ හරහා කලපුවට පැමිණීමයි. නමුත් එය කළපු ජීවීන්ගේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මට්ටමේ පවතින බව මෙහිදී දැකගත හැකිය. 2019 අංක 01 දරන ජාතික පාරිසරික (පරිසර ජල තත්ත්ව) රෙගුලාසිවලට අනුව, කළපු pH අගය සහ අනෙකුත් පෝෂක මට්ටම් සම්මත සීමාවන් තුළ පැවතියත් පොස්පේට් සම්මත අගය (0.4 mg/L)ට වඩා වැඩි ය. පහළ අවසාදිතයෙන් 90% සිහින් වැලි සහිත සංයුක්ත වන අතර 9% ක් මැටි සහ රොන්මඩ නියෝජනය කරයි. විවෘත මුහුදේ වාර්තාගත වඩදිය විස්තාරය සෙන්ටිමීටර 60 කි. වන අතර කලපු මුඛයේ සෙන්ටිමීටර 9ක් සහ කලපුවේ ඉහළ සෙන්ටිමීටර 5ක් විය. කළපු මුඛයේ සිට කළපුවේ ඉහළ දක්වා (කිලෝමීටර 6) emphasized phase ප්‍රමාදය පැය 6ක් පමණ වේ.




රූපය 10: 2023 පළමු අන්තර් මෝසම් කාලය තුල කලපු මතුපිට ලවණතාව රූපය.




රූපය11: 2022 පළමු අන්තර් මෝසම් කාලය තුල කලපු මතුපිට ලවණතාව




රූපසටහන8 :2023 දී සිදු කරන ලද දිය යට සමීක්ෂණය A,B සහ C2018 දී සින්නපාඩුව මුහුදේ ස්ථානගත කරනලද, දිරාපත්ව ඇති මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් අවට කුඩා මත්ස්‍ය ගහනයන්; සහ D දිරාගිය බස්රථ අවට ගැවසෙන කුඩා මත්ස්‍ය ගහනයන් සහ E,F ත්‍රිකුණාමල මුහුදේ ගිල්වන ලද භෞතිකව හානියට පත්වී ඇති වාහන.

## 4. පසුඅස්වනු තාක්ෂණික අංශය

**ව්‍යාපෘතිය1: බහුදින ධීවර යාත්‍රා සඳහා නවීකරනය කළ සිසිලන පද්ධතියක් හඳුන්වා දීම.**

බහුදින ධීවර ක්ෂේත්‍රයේ පසුඅස්වනු හානි ප්‍රතිශතය අවම කිරීමේ අරමුණින් නාරා ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය දියත් කෙරුණේ ධිවර අමාත්‍යාංශය, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) හි මූල්‍යමය දායකත්වය යටතේයි. ව්‍යාපෘතිය යටතේ, තෝරා ගත් බහුදින ධීවර යාත්‍රාවක් මත්ස්‍ය ගබඩාවේ අයිස් දියවීමේ ශීඝ්‍රතාවය අවම වන පරිදි සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීමෙන් හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරිම මගින් නවීකරණයට භාජනය කෙරිණි. මෙසේ නවීකරණය කරන ලද බහුදින ධීවර යාත්‍රාව අග්‍රාමාත්‍ය ගරු දිනේශ් ගුණවර්ධන, ධීවර අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද සහ ධීවර රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ඇතුළු සම්භාවනීය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023 ජනවාරි 03 වන දින දික්ඕවිට වරාය පරිශ්‍රයේ පැවති සමාරම්භකව දියත් කිරීමේ උත්සවයේදී ධීවර ජනතාව වෙත හඳුන්වා දෙනු ලැබිණි. නවීකරණය කරන ලද බහුදින ධීවර යාත්‍රාව මත්ස්‍ය අස්වැන්නේ ගුණාත්මකභාවය තක්සේරු කිරීමේ අධ්‍යයනයන් සිදු කරනු ලබයි.



රූපය 13 : බෝට්ටුවේ සමාරම්භක දියත් කිරීමේ උත්සවය

**ව්‍යාපෘතිය 2: කරවල සහ උම්බලකඩ කර්මාන්තය වැඩිදියුණු කිරීම**

දකුණු පළාතේ කරවල සහ උම්බලකඩ කර්මාන්තය නගාසිටුවිම සඳහා පසුඅස්වනු තාක්ෂණික අංශය ක්‍රියා මාර්ග ගෙන ඇත. මත්ස්‍ය නිශ්පාදනවල ගුණාත්මකබව හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය වැඩි දියුණු කිරීමේ සහ ඒවායේ වෙළඳපොළ වටිනාකම ඉහළ දැමීමේ අරමුණින් මෙම ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), සී-නෝර් පදනම (CEYNOR) සහ පෞද්ගලික අංශය සමග එක්ව, පසු අස්වනු තාක්ෂණික අංශය විසින් සම්ප්‍රදායික රසට හානි නොවන සේ සෞඛ්‍යාරක්ෂිතව උම්බලකඩ නිෂ්පාදනය කිරීම සඳහා නව්‍ය උපකරණ කට්ටලයක් හඳුන්වා දී ඇති අතර, උසස් තත්ත්වයේ නිෂ්පාදන සිදු කළ හැකි පරිදි එම උපකරණ ප්‍රතිලාභීන් හය දෙනෙකු අතර බෙදා හැර ඇත.




රූපය 14 : A : නවීකරනය කරන ලද දුම් ගැසිම B : වියලුම් මේස

## 5. පරිසර අධ්‍යන අංශය

**ව්‍යාපෘතිය1: දකුණු වෙරළ තීරය සඳහා වෙරළ ජල තත්ත්ව දර්ශකය (WQI) සංවර්ධනය කිරීම**

උණවටුන, මිරිස්ස සහ පොල්හේන යන වෙරළ තීරයන්ගේ වත්මන් ජල තත්ත්වය, ජල තත්ත්ව දර්ශකයක් දියුණු කිරීම මඟින් නිර්ණය කිරීම මෙහිදි සිදුකරනු ලැබේ. එසේ ලබාගන්නා දත්ත මගින් එකී වෙරළ තීරයන්ට නිල ධජ සහතිකය ලබාගැනීමේ ශක්‍යතාවය ද අධ්‍යනයය කරනු ලැබේ. සංචාරක කර්මාන්තයෙහි උන්නතිය වෙනුවෙන් මෙම වෙරළ තීරයන් දියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණක් ලෙස දැක්විය හැකිය.

මෙහිදි විශ්ලේෂණයට භාජනය කළ සියලුම භෞතික සහ රසායනික පරාමිතීන් සම්මත ප්‍රමිතීන්ට අනුකූල වූ අතර උණවටුන වෙරළ තීරයේ E.coli මට්ටම **නීල ධජ** සහතිකය ලබාදීම සිදුකරන පාරිසරික අධ්‍යාපනය සඳහා පදනම විසින් නිර්ණය කරන ලද අගයන් ඉක්මවා ඇතිබව තහවුරු විය.



රූපය15B:මිරිස්ස වෙරළ තීරයේ ජල නියැදීම, සහ 15C පොල්හේන වෙරළ තීරයේ ජල සාම්පල එකතු කිරීම

**ව්‍යාපෘතිය 2: හලාවත කළපුවෙහි තිරසර සංවර්ධන සැලස්ම සඳහා නිරීක්ෂණ**

හලාවත කළපුවෙහි ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිඵලවලට අනුව, ජල ද්‍රාව්‍ය ඔක්සිජන් ප්‍රමාණය සහ ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම යන පරාමිතීන්හි මධ්‍යන අගයන්, 2019 අංක 01 දරන ජාතික පාරිසරික රෙගුලාසි හි සම්මත ජල තත්ත්ව ප්‍රමිති අගයන් ඉක්මවා යාමට ඉතා ආසන්න විය. එමෙන්ම ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම සහ තෙල්/ ග්‍රීස් සාන්ද්‍රණය ඉහත ප්‍රමිතින්හි උපරිම අගයන් ඉක්මවා ඇත. කළපුවේ දකුණු ඉවුර ආසන්නයේ සහ යාබද ඉස්සන් කොටු ඇති ස්ථාන කිහිපයක ඇල්ගී උඩුමණ්ඩි තත්ත්වයන් දැකිය හැකි විය. එම ඇල්ගී නියැදි පරීක්ෂා කිරීමේදී *Oscillatoria* වර්ගය ප්‍රමුඛ බව අනාවරණය විය.

## 6. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය


**ව්‍යාපෘතිය 1: ජාතික සිතියම්කරණ වැඩසටහන**

කොළඹ සිට වැලිගම දක්වා ඉලෙක්ට්‍රොනික නාවික සිතියම (ENC) සකස් කිරීම සඳහා භූ ලක්ෂණ දත්ත රැස් කිරීම ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ සිදු කර ඇත.

**ව්‍යාපෘතිය 2: "GEBCO" /Nippon පදනමේ මුහුදු පතුල 2030 ගෝලීය සිතියම්කරණ ව්‍යාපෘතියට සමගාමීව සමූහ ජල විද්‍යාත්මක දත්ත සඳහා දත්ත සමුදාය සහ ඩිජිටල් දත්ත සැකසීමට ඒකකයක් පිහිටුවීම**

විද්‍යාත්මක පර්යේෂණ, නාවික ගමනාගමනය සඳහා ආරක්ෂාව, පාරිසරික අධීක්ෂණය, හෙළි නොවූ භූ විද්‍යාත්මක ලක්ෂණ සොයා ගැනීම යනාදියට දායක වන අපගේ EEZ හි මුහුදු පත්ලේ සිතියමක් ජනනය කිරීම අරමුණයි. සමූහික මූලාශ්‍ර කරගත් ජලශාස්ත්‍රීය දත්ත මෙම ව්‍යාපෘතියට යොදා ගන්නා අතර මෙම සමූහික දත්ත ස්වේච්ඡාවෙන්, පර්යේෂකයන්ගෙන්, මැනුම් සඳහා නොවූ යාත්‍රා (වාණිජ සහ මසුන් අල්ලන යාත්‍රා ) මඟින් රැස්කරගත් දත්ත වේ. එසේ රැස්කරගත් සාමූහික දත්ත සැකසීම සහ දත්ත ගබඩාව පවත්වාගෙන යාම මෙහි අනෙකුත් කාර්යයන් වේ.

2023 ජනවාරි සිට අගෝස්තු දක්වා, Fridget of Nanson bathy, Cable laying ship Mv.Responder, සහ SEA ME WE 6 සබ්මැරීන් කේබල් ව්‍යාපෘතියෙන් ලබාගත් ජලශාස්ත්‍රීය දත්ත සමඟ දත්ත සැකසීම සහ දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සිදු කර ඇත.





රූපය16. සමූහ මූලාශ්‍ර ජලශාස්ත්‍රීය දත්ත ව්‍යාපෘතිය

